**ජාතික ඉතිරිකිරීමේ බැංකුව - 2022**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") සහ බැංකුවේ හා එහි පරිපාලිතයේ සමාගම්වල ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයසහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, බැංකුවේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,බැංකුව සහ සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව සහ සමූහය කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව බැංකුව සහ සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලියට අතින් සිදු කරනු ලබන මැදිහත් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳ ඉහළ අවදානමක් නිරීක්ෂණය විය. ප්‍රධාන ශේෂ පිරික්සුම්දෙකක් ශාඛා සඳහා සහ ප්‍රධාන කාර්යාලය සඳහා වෙන වෙනම සකස් කරයි. සියලුම ශාඛාවල ශේෂ පිරික්සුම් CBOS (Central Back Office System ) පද්ධතියෙන් සාරාංශ කර එය MS Excel පැතුරුම් පත් ආකෘතියට පරිවර්තනය කරමින් ශාඛා සඳහා තනි ශේෂ පිරික්සුම් නිර්මාණය කරයි. ප්‍රධාන කාර්යාල අංශවල ශේෂ පිරික්සුම් වෙන වෙනම ගෙන ප්‍රධාන කාර්යාලය සඳහා තනි ශේෂ පිරික්සුමකට ඒකාබද්ධ කෙරේ. අවසාන වශයෙන්, ශේෂ පිරික්සුම් දෙකම භාවිතා කරමින්, මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. මෙය දත්ත නැතිවීමට හෝ හැසිරවීමට හේතු විය හැක. එබැවින්, දත්ත නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස් කිරීමට පූර්ණ ස්වයංක්‍රීය පද්ධති විසඳුමක අවශ්‍යතාවය බැංකුව විසින් ඇගයීමට ලක් කළ යුතුය. | වර්තමානයේදී, පරිගණකගත පොදු ලෙජරපද්ධති ලෙස ශාඛා පොදු ලෙජරය සහ ප්‍රධාන කාර්යාලයේ පොදු ලෙජරය වෙන වෙනම පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, ගනුදෙනු සඳහා අතින් සිදු කරනු ලබන(Manual) මැදිහත්වීමක් පවතින විට තනි තනි පොදු ලේජරපද්ධති වෙත ගනුදෙනු ග්‍රහණය කර ගැනීම සහ වාර්තා කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පාලනයන් ක්‍රියාත්මක වේ. සියලුම ශේෂ පිරික්සුම්පොදු ලේජරපද්ධති හරහා ජනනය වන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා MS Excel පැතුරුම් පත් භාවිතා කරනු ලබයි.එමෙන්ම, මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා අදාළ පාලනයන් ක්‍රියාත්මක වේ. මූල්‍ය වර්ෂය අවසන් කිරීමට පෙර එක්සේල් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලාභය පොදු ලේජර පද්ධතියේ වාර්තා කර ඇති ලාභය සමඟ සියයට 100ක් සසඳන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පවත්වා ගෙන යනු ලබයි. තවද, වත්මන් ක්‍රමයේ පවතින අතින් සිදු කරනු ලබන මැදිහත්වීම් මඟහරවා ගැනීම සඳහා මූලික බැංකුකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අතින් සිදු කරනු ලබන මැදිහත් වීම අවම කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අන්තර් ශාඛා ශේෂය රු. 103,260,737 ක් වූ අතර ඉකුත් වසරේ අනුරූප ශේෂය රු. 407,412,355 ක් විය. ශාඛා ලෙජර සහ ප්‍රධාන කාර්යාල ලෙජර ගිණුම් කිහිපයක් එකතු කිරීමෙන් මෙම ශේෂය ලබාගෙන ඇත. මෙම ශේෂවලින් සමහර ශේෂයන් වසර කිහිපයකට පෙර සිට පවතී. කෙසේ වෙතත්, මෙම අන්තර් ශාඛා ගිණුම් | අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා පහත ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ.<br>අතින් පිළියෙල කල ප්‍රධාන කාර්යාල අප ගිණුම<br>නිරවුල් කිරීම සඳහා ශේෂයන් අධීක්ෂණය කිරීමට ශාඛා මගින් මාසිකව සැසඳීමේ ප්‍රකාශන සකස් කරමින් පවතී.<br>ස්වයංක්‍රීය ප්‍රධාන කාර්යාලය අප ගිණුම්<br>අන්තර් ශාඛා ශේෂයන් සංසන්දනය | අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කළ යුතුය. |

| | |
|---|---|
| ශේෂයන් සැසඳීම සඳහා බැංකුව විසින් කිසිදු ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කිරීම මාසිකව සකස් කරනු ලබන අතර පියවීම් ගිණුම් ඇතුළු නිරවුල් කිරීම සඳහා ශේෂයන් නිරීක්ෂණය කිරීම සඳහා නිතිපතා රැස්වීම් පවත්වනු ලැබේ. 2021 දී වාර්තා වූ අන්තර් ශාඛා ශේෂය රු.407,412,355 ක් වූ අතර 2022 දී එය රු.103,260,737 ක් දක්වා අඩු වී ඇත. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| අ | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 47 වන වගන්තිය | බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට හිමිකම් නොපෑ තැන්පතු සංචිත ගිණුම හරහා කරන ලද ගෙවීම් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කළ යුතුය. කෙසේ වෙතත්, 2022 අවසානය දක්වා ගනුදෙනුකරුවන්ට ගෙවා ඇති රු. මිලියන 1,035න් රු. මිලියන 570 ක් 2023 ජූලි 31 වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා දැනටමත් ඉල්ලීමක් කර ඇත. | බැංකුපනතේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල විය යුතුය. |
| ආ | 2007 අංක 12 දරන බැංකු පනත්නියෝගය අනුව අනුකූලතා අවශ්‍යතා<br><br>වගන්ති අංක 3(1) (vii) (ix) සහ 3(1) (x) | අදාළ නියෝගයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කාර්යාල සේවා හැසිරවීම සහ ව්‍යවස්ථාපිත හා අනෙකුත් රෙගුලාසිවල දක්වා ඇති අනෙකුත් කාර්යයන් ඉටු කිරීම සමාගම් ලේකම්වරයාගේ මූලික වගකීම වේ. සමාගම් ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වා ගත යුතු අතර අධ්‍යක්ෂවරුන්ට එවැනි රැස්වීම් වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් ඇත. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ පැමිණීම මගහැර අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් පවත්වා ඇති බවට ඇතැම් අවස්ථා නිරීක්ෂණය විය. | 2023.05.24 දිනැති වත්මන් අධ්‍යක්ෂක මණ්ඩලයේ 3 වන රැස්වීමේදී මෙම අවශ්‍යතාවය අවධාරණය කර ඇති අතර එය සිදු නොවන බවට තහවුරු විය. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අදාළ වගන්තිවලට බැංකුව අනුකූල විය යුතුය. |
| | වගන්ති අංක 3 (2) (iv) | අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු | මෙම අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් විසින් | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අදාළ |

| | | | |
|---|---|---|---|
| | හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් යන දෙකෙන් වැඩි සංඛ්‍යාව සිටිය යුතු වුවත්, 2022 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පමණක් පත් කර ඇති අතර අනෙකුත් අධ්‍යක්ෂවරුන් පස්දෙනාම ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නම් කරඇත. | 2022.12.21, 2023.01.31 සහ 2023.07.21යන දිනවලදී පත්කිරීමේ බලධාරියා (භාණ්ඩාගාර ලේකම්) වෙත දන්වා ඇත. | වගන්තිවලට බැංකුව අනුකූල විය යුතුය. |
| වගන්ති අංක 3.2 (i) සහ 3. 2 (ix) | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) (ඒ) වගන්තියට අනුව, අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාස හතරක කාලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉහත සඳහන් කළ මාස හතරක කාලය තුළ බැංකුවේ සියලුම කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය නොමැතිව සිදු කර ඇති අතර නව පත්වීම් 2023 මැයි මාසයේදී සිදු විය.<br>2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ අධ්‍යක්ෂවරුන්ගේ අවම අවශ්‍යතා සපුරාලීමට බැංකුවට නොහැකි වූ අතර එබැවින් ආයතනික යහපාලන නියෝගයේ 3.2 (i) වගන්තියට අනුකූල නොවීම නිරීක්ෂණය විය. | මෙම අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් විසින් 2022.12.21, 2023.01.31 සහ 2023.07.21 යන දිනවලදී පත්කිරීමේ බලධාරියා (භාණ්ඩාගාර ලේකම්) වෙත දන්වා ඇත. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අදාළ වගන්තිවලට බැංකුව අනුකූල විය යුතුය. |
| වගන්ති අංක 3 (6) (ii) (ඒ) | විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු විය යුතු වුවද, බැංකුවේ පරිපාලිත ආයතනයක් විගණන කමිටුවේ සභාපති ධූරය දැරීම හේතුවෙන් බැංකුවේ විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු නොවීය. | මෙම අවශ්‍යතාවය 2022.05.12 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ඊළඟ පත්වීමේදී එය සිහිකැඳවීම කරනු ඇත. | 2007 අංක 12 දරන බැංකු පනත්නියෝගයේ අදාළ වගන්තියටබැංකුව අනුකූල විය යුතුය. |
| වගන්ති අංක(3)(6)(iv)( | නාමයෝජනා කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් | අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් | 2007 අංක 12 දරන බැංකු |

| | | | | |
|---|---|---|---|---|
| | එෆ්) | සභාපතීත්වය දරනු ලැබිය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් සමන්විත වීම වඩාත් සුදුසු වුවද, සභාපතිවරයා සහ කමිටුවේ බහුතරය පවා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය. | අධ්‍යක්ෂවරුන් පත්කිරීමේදී සහ නැවත පත්කිරීමේදී මෙම අවශ්‍යතාවය පත්කිරීමේ බලධාරියා වෙත දන්වනු ඇත. | පනත්නියෝගයේ අදාළ වගන්තියටබැංකුව අනුකූල විය යුතුය. |
| ඇ | 2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඕනෑම රාජ්‍ය ව්‍යවසායක සභාපතිවරයෙකුට එක් නිල වාහනයක් පමණක් භාවිතා කිරීමට සහ මසකට ලීටර් 150 ට සමාන ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හිමිකම් ඇතත්, චක්‍රලේඛය මගින් දක්වා ඇති සීමාවන් ඉක්මවා 2021 වර්ෂය තුළදී බැංකුවේ හිටපු සභාපතිනිය වාහන දෙකක් භාවිතා කර තිබූ අතර ඉන්ධන ලීටර් 4,401.64 ක් බැංකුවෙන් සහ ඉන්ධන ලීටර් 1,800 ක් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබා ගෙන තිබුණි. | බැංකුවේ සභාපතිනිය බැංකුවේ ඉතුරුම් ප්‍රවර්ධන ව්‍යාපාරවලට සහභාගී වන අතර එම නිසා මුළු දිවයිනම ආවරණය වන පරිදි ශාඛා ජාලය හරහා චාරිකාවේ යෙදේ. එසේම, ඇය තම උපන් ගම වන මහනුවර සිට කොළඹ දක්වා ගමන් කරයි. තවද, සභාපති විසින් වසර 6ක් පැරණි එන්ජින් ධාරිතාව CC 2982 කින් යුත් CAT 1972 දරන වාහනය භාවිතා කරන අතර එහි ඉන්ධන පරිභෝජනය ඉතා ඉහළ අගයක් ගනී. සංචිතයේ ඇති අනෙත් වාහනය එනම් KU 8117 දරන වාහනයද වසර 10 කට වඩා පැරණි වන අතර CAT 1972දරන වාහනය සේවා කටයුතු, අලුත්වැඩියාව සහ නඩත්තුව හේතුවෙන් භාවිතා කළ නොහැකි අවස්ථාවකදී සභාපතිනිය විසින් මෙම වාහනය භාවිතා කරයි. KU 8117 හි ඉන්ධන පරිභෝජනය ද ඉතා ඉහළ අගයක් ගනී. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අදාළ චක්‍රලේඛ උපදෙස්වලට බැංකුව අනුකූල විය යුතුය. |
| ඇ | 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සාමූහික ගිවිසුමට අනුව උපයන විට ගෙවන බද්ද හෝ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දබැංකුව විසින් අදාළ සේවකයාගේ වැටුපෙන් අඩු කිරීම වෙනුවට තම | සාමූහික ගිවිසුමට අනුව, 2022 දෙසැම්බර් 31 දක්වා උපයන විට ගෙවන බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද බැංකුව විසින් ගෙවා ඇත. කෙසේ | බැංකුව එහි සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවන බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද නොදැරිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අරමුදල්වලින් ගෙවා තිබුණි. පසුගිය වසර පහක ගෙවීම් විස්තර පහත පරිදි වේ.<br>තක්සේරු වර්ෂය — මුදල රු.මිලියන<br>2016/2017 — 155.15<br>2017/2018 — 157.11<br>2018/2019 — 125.75<br>2019/2020 — 146.8<br>2020/2021 — 11.8<br>2021/2022 — 30.44<br>2022/2023 (2023 ජනවාරි 01 දක්වා) — 42.99 | වෙතත්, 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උපයන විට ගෙවන බද්ද අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු කරයි. | |
| ඉ | ආයතනික යහපාලනයේ අනුකූලතා පිළිබඳ අවශ්‍යතා නියෝග අංක 3 (6) iii (ඩී) සහ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටුවේ (BHRRC) හි යොමු කිරිමේ අනුදෙය (TOR) හි අංක 2.1 (ඩී) දරන ඡේදය | ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන විට ප්‍රධාන විධායක නිලධාරියා කමිටු රැස්වීම්වලට සහභාගි නොවිය යුතු වුවද, සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුප උපරිම වැටුප් පියවරේ තබා ගැනීමට තීරණය කර තිබූ 2022 අප්‍රේල් 05 වන දින පැවති රැස්වීමට සාමාන්‍යාධිකාරීවරයා සහභාගී වී තිබුණි. | මෙම කාරණය සලකා බලන විට සාමාන්‍යාධිකාරීවරයා පැමිණ සිටියේද නැද්ද යන්න පිළිබඳව 2022.04.05 දින පැවති BHRRC රැස්වීම් වාර්තාවේ සඳහන් නොවේ.<br>කෙසේ වෙතත්, මෙම කාරණය කැඳවූ අවස්ථාවේදී සාමාන්‍යාධිකාරීවරයා සමාව ඉල්ලා තිබූ බව 2022.04.25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සඳහන් කර ඇත. | ආයතනික පාලන නියෝගවලට සහ BHRRC හි යොමු කිරිමේ අනුදෙය (TOR) ට බැංකුව අනුකූල විය යුතුය. |
| ඊ | 2021 නොවැම්බර් 16 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් | සාමූහික ගිවිසුම යටතේ වේතන තීරණය කිරීමේදී රාජ්‍ය බැංකු ඇතුළු රාජ්‍ය ව්‍යවසායන් වැටුප් සංශෝධනය සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඉල්ලා සිටිය යුතු බව සඳහන් වුවද, මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුප, | රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.1 (ii) වගන්තිය මගින් **වැටුප් සංශෝධන සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඉල්ලා සිටිය යුතු බව**දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය | මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද වැටුප් පියවර මහා භාණ්ඩාගාරයේ එකඟතාවයකින් තොරව වෙනස් නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| අත්පොතේ 3.1 (ii) වගන්තිය | සාමාන්‍යාධිකාරී තනතුරට උසස් කළ දින සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍යාධිකාරී කාණ්ඩයේ වැටුප් පරිමාණයේ 5 වැනි වැටුප් පියවරේ (උපරිම පියවර) තැබීමට සහ ඒ අනුව හිඟ වැටුප් ගෙවීමට 2022 අප්‍රේල් 25 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අනුමැතිය ලබා දී තිබුණි. එබැවින්, 2023 අප්‍රේල් මාසය දක්වා හිඟ වැටුප් සමඟ රු. 6,375,840 ක අමතර වැටුපක් සාමාන්‍යාධිකාරීවරයා වෙත ගෙවා තිබුණි. | සාමාන්‍යාධිකාරීවරයාට වැටුප් සංශෝධනයක් කර නොමැත. මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුප දැනට පවතින වැටුප් පරිමාණයේ 5 වන පියවරට තැබීම පමණක් සිදු කර ඇත. ඒ අනුව, මහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගැනීම අවශ්‍ය නොවන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පනතේ 26 (3) වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම තීරණය ගෙන තිබුණි.<br>තවද, 2022.04.25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව මෙම තීරණයට එළැඹ ඇති අතර, ඊට අධ්‍යක්ෂ මණ්ඩලයේමුදල් අමාත්‍යාංශ භාණ්ඩාගාර නියෝජිතයාද සහභාගී වී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2,529 ක ලාභයක් වූ අතර ඊට අනුරූප පෙර වර්ෂයේ ලාභය රු. මිලියන 22,119 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 19,590 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ශුද්ධ පොලී ආදායම රු. මිලියන 22,166 කින් පහළ යාම හේතු වී තිබුණි.
2022 වර්ෂය තුළදී, ණය සහ අත්තිකාරම්, ණය සහ අනෙකුත් උපකරණ සහ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොලීවලින් ලද පොලී වැඩිවීම හේතුවෙන් බැංකුවේ මුළු පොලී ආදායම රු. මිලියන 41,502 කින් හෙවත් සියයට 31 කින් ඉහළ ගොස් තිබුණි. තැන්පත්කරුවන් සඳහා ගෙවන ලද පොලී වැඩිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා මුළු පොලී වියදම් රු. මිලියන 63,669 කින් හෙවත් සියයට 82 කින් ඉහළ ගොස් තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| විස්තර | විචලා මුදල වැඩි වීම/(අඩු වීම) (රු .000) | විචලනය % | විචලනයට හේතුව |
|---|---|---|---|
| ශුද්ධ පොලී ආදායම | (22,166,660) | (41) | ප්‍රධාන වශයෙන් පොලී අනුපාත වැඩිවීම නිසා තැන්පත්කරුවන්ට ගෙවිය යුතු පොලී වියදම් රු. මිලියන 61,056 කින් වැඩි වීම. |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | (902,762) | (32) | ණය ආශ්‍රිත සේවාවන්ගෙන් උපයන ගාස්තු සහ කොමිස් ආදායම අඩුවීම. |
| ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම | (103,791) | (20) | ලාභාංශ ආදායම රු. මිලියන 138.58 කින් අඩුවී තිබුණි. |
| හානිකරණ ගාස්තු | (557,754) | (13) | රට තුළ පැවති අහිතකර ආර්ථික බලපෑම් හේතුවෙන් ප්‍රධාන වශයෙන් 3 වන අදියර යටතේ වර්ගීකරණය කරන ලද ණය ප්‍රමාණය වැඩිවීම නිසා ණය සහ අත්තිකාරම් සඳහා වන හානිකරණ ප්‍රතිපාදන සියයට 76 කින් හෙවත් රු. මිලියන 2,279 කින් වැඩි වීතිබුණි. |
| මුළු වියදම් | 2,120,373 | 11 | කාර්යාල පරිපාලන හා ආයතනික වියදම් සහ නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වන දායකත්වය පිළිවෙලින් රු. මිලියන 1,003කින් සහ රු. මිලියන 973කින් වැඩි වී තිබුණි. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| විස්තර | ආංශික අනුපාතය * | බැංකුව | |
|---|---|---|---|
| **ලාභදායිතා අනුපාතය** | | **2022** | **2021** |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්ඕඊ) (ROE) (%) | 2.3 | 3.40 | 33.92 |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්ඕඒ) (ROA) (%) | 0.1 | 0.28 | 1.93 |
| පොලී ආන්තිකය | 2.8 | 2.03 | 3.71 |
| **වත්කම් ගුණාත්මක අනුපාතය** | | | |
| මුළු ණයවලට ස්ථීර 3 ණය අනුපාතය (ශුද්ධ හානිකරණය) | 11.3 | 2.82 | 2.54 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR)** | | | |
| CAR -ස්ථර I අනුපාතය (අවමය 8% කි) | 14.2 | 15.78 | 18.60 |
| මුළු CAR අනුපාතය (අවමය 12% කි) | 17.7 | 18 | 20.83 |

| | | | |
|---|---|---|---|
| **ද්‍රවශීලතා අනුපාතය** | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (අවමය සියයට20 කි) | 30.9 | 40.62 | 59.63 |

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලින් ආංශික අනුපාත උපුටා ගෙන ඇත.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී බැංකුවේ ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) අනුපාතය සහ වත්කම් මත ප්‍රතිලාභ (ROE) අනුපාතය පිළිවෙලින් සියයට 30.52 කින් සහ සියයට 1.65 කින් අඩු වී තිබුණි.

(ii) පසුගිය වර්ෂය හා සසඳන විට ද්‍රවශීලතා වත්කම් අනුපාතය සියයට 19.01 කින් අඩු වී තිබුණු අතර එය කර්මාන්තයේ සාමාන්‍ය අනුපාතය වූ සියයට 30.9 ට වඩා වැඩි ය.

(iii) බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 2022 දෙසැම්බර් 31 වන දිනට සියයට 2.8 කින් අඩු වී තිබුණු අතර එය එනම් සියයට 18, අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 12 ට වඩා වැඩි ය.

(iv) 2022 වසරේ බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 1.68 කින් අඩු වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ පොලී ආන්තිකය කර්මාන්තයේ පොලී ආන්තිකය වන සියයට 2.8 ට වඩා සැලකිය යුතු ලෙස අඩු ය. බැංකුවේ පොලී ආදායම ඉහළ යාමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් පොලී වියදම් ඉහළ යාම පොලී ආන්තිකය අඩු වීමට හේතු විය.

ප්‍රධාන වශයෙන් 2022 වර්ෂය තුළදී ගණුදෙනුකරුවන් අඩු ඵලදාවේ සිට ඉහළ ඵලදාවක් ලබා දෙන ස්ථාවර තැන්පතු වෙත ගමන් කිරීම නිසා පොලී වියදම වැඩි විය. ස්ථාවර කොන්දේසි යටතේ බැංකුව විසින් ලබා දී ඇති ණය සහ අත්තිකාරම්වල අඩු පොලී අනුපාත නැවත මිල කිරීමට බැංකුවට නොහැකි වීම හේතුවෙන් පොලී ආදායම, පොලී වියදමට සාපේක්ෂව අඩු ප්‍රතිශතයකින් වැඩි විය. එසේම බැංකු තැන්පතුවලින් සියයට 60 ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුකූලව අඩු පොලී අනුපාත යටතේ කරන ලද දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය නැවත මිල කිරීමක් සිදු නොවීය.

## 2.4 කාර්ය මණ්ඩල පිරිවැය විශ්ලේෂණය

(i) බැංකුව එක් සේවකයෙකු සඳහා වසරකට රු. මිලියන 3.05ක වියදමක් දැරුවද, 2022 වසර සඳහා එක් සේවකයෙකුගෙන් උපයාගත් ලාභය රු. මිලියන 0.56ක් පමණක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනෙකුත් බැංකු 2022 වර්ෂය තුළදී සේවකයෙකුගෙන් රු.මිලියන 2.33කට වඩා වැඩි ලාභයක් වාර්තා කර තිබුණි.

(ii) 2022 වසර සඳහා බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පුද්ගලික වියදම් සියයට 47.6 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය තුළදී අනෙකුත් රාජ්‍ය බැංකු හා සසඳන විට ඉහළම අගය නියෝජනය කරයි.

| විස්තරය | බැංකුව | මහජන බැංකුව | ලංකා බැංකුව |
|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 4528 | 7377 | 8209 |
| ශාඛා සංඛ්‍යාව | 262 | 745 | 581 |
| එක් සේවකයෙකු සඳහා පිරිවැය (රු. මිලියන) | 3.05 | 3.61 | 3.53 |
| සේවකයෙකු සඳහා ලාභය (රු. මිලියන.) | 0.56 | 2.33 | 3.89 |
| ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පුද්ගලික වියදම් | 47.6 | 34.61 | 32.36 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට වංචනික ක්‍රියාකාරකම් 89 කින් බැංකුවට සිදු වූ මුළු අලාභය රු.මිලියන 58.37 ක් වූ අතර එය 2023 මැයි 31 දිනට ක්‍රියාකාරකම් 95 කින් රු.මිලියන 60.56 දක්වා වැඩි වී තිබුණි. ඒවා අතරින් රු.මිලියන 41.47 ක අලාභ වසර පහකට වඩා පැරණි ය. වංචනික සිද්ධීන් පහළොවකින්(15) බැංකුවට සිදු වූ රු.මිලියන 87.24 කමුළු අලාභය කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කර තිබුණු අතර එම අලාභවල හිඟ ශේෂය රු. මිලියන 46.89 ක් හෙවත් 2023 මැයි 31 දිනට මුළු අලාභය වූ රු. මිලියන 60.56න් සියයට 77 ක් විය. සිද්ධීන් හතළිස් නවයක් (49) ක් 2021, 2022 සහ 2023 වර්ෂවල සිදුවී ඇති ATM කාඩ්පත් ආශ්‍රිත වංචාවන් වේ. ඉන් රු. මිලියන 3.22ක වටිනාකමකින් යුත් වංචා 38 ක්, තුන්වැනි පාර්ශවයක් විසින් ගෙවුම් යෙදුමක් හරහා හැක් කරන ලද කාඩ්පත් ආශ්‍රිත තොරතුරු භාවිතයෙන් මාර්ගගත ගණුදෙනු සිදු කිරීම මඟින් කර තිබුණි. විගණිත දිනය වූ 2023 මැයි 31 දින දක්වා හැක් කිරීම් ආශ්‍රිත වංචනික සිද්ධීන් 38ක් සඳහා කිසිදු රක්ෂණ වන්දියක් ලැබී නොතිබුණි. | • වසර පහකට වඩා පැරණි රු.මිලියන 41 ක් වූ වංචාවලින් රු. මිලියන 37 ක් විභාග වෙමින් පවතින නඩුවලට අදාළ වේ.<br>• 2023 මැයි 31 දිනට කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කරන ලදවංචාවල මුළු හිඟ ශේෂය වූ රු. මිලියන 46.89 ක් අතරින් රු මිලියන 37 ක් විභාග වෙමින් පවතින නඩුවලට අදාළ වේ.<br>• ATM කාඩ්පත් ආශ්‍රිත සිද්ධීන් 49 න් 38 ක් සඳහා පරීක්ෂණ සිදු කරමින් පවතී.<br>ශාඛා මෙහෙයුම්වල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• අදාළ සියලුම අත්පොත්, චක්‍රලේඛ, චක්‍රලේඛ ලිපි සහ උපදෙස් ලිපි දැඩි ලෙස පිළිපැදීමේ වැදගත්කම අවධාරණය කිරීම සඳහා 2017 ජූනි 13 දිනැති අංක 453/2017 දරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ උපදෙස් ලිපිය, 2019 ඔක්තෝබර් 21 දිනැති අංක 569/2019 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ උපදෙස් ලිපිය සහ 2023 අගෝස්තු 28 දිනැති අංක 637/2023 දරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ උපදෙස් ලිපිය නිකුත් කර ඇත. විගණන වාර්තාවල පෙන්වා දී ඇති පරිදි මෙම ලේඛන ශාඛා මෙහෙයුම්වලදී උල්ලංඝනය කර ඇති බවට අවධාරනය කර ඇත.<br>• සියලුම ශාඛා මෙහෙයුම් නියමිත අභ්‍යන්තර පාලන ක්‍රමවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා නිතිපතා සංචාරයන් සිදු කිරීමට සහ ශාඛා සමීපව අධීක්ෂණය කිරීමට ප්‍රාදේශීය කළමනාකරුවන්ට උපදෙස් නිකුත් කර ඇත. | වංචනික ක්‍රියාකාරකම් වළක්වා ගැනීමට සහ ඒවා අඛණ්ඩව අධීක්ෂණය කිරීමට බැංකුව විසින් ශාඛා මෙහෙයුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

- පරිපාලන අංශය/ශාඛා කළමනාකරණ අංශය විසින් වංචනික මුදල් ආපසු ගැනීමේ ගිණුම් අඛණ්ඩව පසු විපරම් කරන අතර ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.
- වංචනික ලෙස මුදල් ආපසු ගැනීම්වලින් ඇති විය හැකි පාඩු සඳහා රු. මිලියන 57.6ක් වූ ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත. (ආපසු අයකර ගත හැකි මුදල ගැලපීමෙන් පසු)

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | මේ වන විට වසර 07කට වැඩි කාලයක් ගත වී ඇතත්, 2016 අප්‍රේල් මාසයේ සිට එ.ජ.ඩො 13,015,224 ක (සංශෝධිත - බදු රහිත) ඇස්තමේන්තුගත වියදමින් ආරම්භ කරන ලද මූලික බැංකුකරණ විසඳුම් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට බැංකුව අපොහොසත් වී තිබූ අතර එ.ජ.ඩො 5,117,654.05 ක් මේ දක්වා වියදම් කර තිබුණි. කර්මාන්තයේ අනෙකුත් බැංකු නිරන්තරයෙන් නවීන තාක්‍ෂණයන් වැලඳ ගැනීම මධ්‍යයේ මෙවැනි ඉහළ තාක්‍ෂණික යෙදුම් ක්‍රියාත්මක කිරීමට මෙතරම් දිගු කාලයක් ගත කිරීම අවසානයේ පද්ධතිය යල්පැනීමට හේතු විය හැක. | බැංකුව 2016 අප්‍රේල් මාසයේදී මූලික බැංකුකරණ විසඳුම ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ අතර ටෙමෙනොස්-AG / ටෙමෙනොස් මූලස්ථානය-SA වෙත ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2019 අප්‍රේල් මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇත.<br>මූලික බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය 2019 ඔක්තෝම්බර් මස සිට පමණක් ආරම්භ කරන ලද අතර ව්‍යාපාරික අවශ්‍යතා එක්රැස් කිරීමේ වැඩමුළු අවසන් කිරීමෙන් පසුව ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුගේ උපදේශකයින් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රටින්පිටත්ව ගිය අතර ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමේ ප්‍රමාදයට සෘජුවම බලපෑ ජාත්‍යන්තර ගමනාගමනයට පැවති සීමාකිරීම් හේතුවෙන් ඔවුන්ට 2021 සැප්තැම්බර් වන තෙක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකි විය. තවද, බැංකුවේ අවශ්‍යතා අනුව ණය සම්භවය (loan origination) සහ වෙනත් මොඩියුල ඇතුළත් කිරීම සහ ශාඛා 5ක සිට බිග් බැන්ග් (big bang) ප්‍රවේශය දක්වා මාරුවීමේ ප්‍රවේශය වෙනස් කිරීම හේතුවෙන් අමතර කාලයක් වෙන් කිරීමට සිදුවිය. | සාධාරණ කාලසීමාවක් තුළ මූලික බැංකුකරණපද්ධතිය වැනි තාක්ෂණික යෙදුම් සම්පූර්ණ කිරීමට හැකි සෑම උත්සහායක්ම ගැනීම අවශ්‍ය වේ. |

තවද, 2022 අප්‍රේල් සිට අගෝස්තු දක්වා රට තුළ ඇති වූ නොසන්සුන්තා හේතුවෙන් ආරක්ෂක හේතූන් මත උපදේශකයින් රටින් පිට ස්ථාන වල සිට සේවය කිරීම ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ප්‍රගතියට අහිතකර ලෙස බලපෑවේය.

මූලික බැංකුකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම සඳහා මූලික ඇස්තමේන්තුගත කාල රාමුව මාස 18-24 ක් වූ අතර මූලික ප්‍රධාන ව්‍යාපෘති සැලැස්මට අනුව ව්‍යාපෘතිය 2021 වර්ෂයේ 2 වැනි කාර්තුවේදී නිම කිරීමට නියමිතව තිබුණි.

කොවිඩ්-19 වසංගතය සහ අනෙකුත් වෙනස්කම් හේතුවෙන් ව්‍යාපෘති කාලසීමාවන්ට ඇති බලපෑම අවම කිරීම සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘති ක්‍රියාකාරකම් සමගාමීව සිදු කර ඇත. ඒ අනුව, අතුරු මුහුණත් 2-3 ක් හැර විශ්ලේෂණය කිරීමේ, සැලසුම් කිරීමේ සහ ගොඩනැගීමේ අදියරයන් අවසන් කර ඇත. SIT සහ UAT පරීක්ෂණ කටයුතු දෙකම සමාන්තරව සිදු කරමින් පවතී.

2023 සැප්තැම්බර් අවසානය වන විට එය සජීවීව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, දත්ත සංක්‍රමණය සහ කාර්ය සාධනය පරීක්ෂා කිරීම/හැරීම සඳහා අවශ්‍ය තවත් වැඩිදියුණු කිරීම් හේතුවෙන් ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. CEFTS, අන්තර්ජාල බැංකුකරණය, SLIPS, ගෙවීම් යෙදුම් (Payment App) වැනි තීරණාත්මක අතුරු මුහුණත් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කළ නොහැකි වීම, මෙහෙයුම් ක්‍රියාවලි වසා දැමීමේ (COB) ක්‍රියාවලිය (Close of business process) ප්‍රශස්ත කිරීම සහ ණය සම්භවය සම්බන්ධ දෝෂ හා 2023 අගෝස්තු මාසයේදී නිකුත් කරන ලද AA ණය දීමේ මොඩියුලය.

බැංකුව විසින් ව්‍යාපාර අවශ්‍යතා තීරණය කරන අවස්ථාවේදී එනම් 2021 දී පැවති මූලික බැංකුකරණ විසඳුමේ නවතම අනුවාදය ක්‍රියාත්මක කරයි. එබැවින්, නවතම අංගයන්ගෙන් සහ හැකියාවන්ගෙන් යුත් මූලික බැංකුකරණ

පද්ධතියක් බැංකුව සතු වේ.

ආ බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරීත්වය විසින් අවදානම් කළමනාකරණ අංශය විසින් ලබා දී ඇති නිර්දේශ සහ අදහස් නොසලකා හැර ඇති අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. අවදානම් කළමනාකරණ අංශය විසින් සිය අවදානම් තක්සේරු වාර්තා මගින් සමහර ප්‍රධාන ණය සම්බන්ධ අවදානම් පැහැදිලිව හඳුනාගෙන ඇතත්, අවධාරණය කළ අවදානම් සැලකිල්ලට නොගෙන එවැනි ණය ලබා දීමට ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. එම ණයවලින් සමහරක් 2023 මැයි 31 දිනට අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි.ණය ගැණුම්කරුවන් සඳහා ලබා දී ඇති එවැනි ප්‍රධාන ණය තුනක් පහත දැක්වේ.

| ණය ගැණුම්කරු. | ණය ප්‍රදානය කළ වර්ෂය | ප්‍රදානය කළ මුදල (රු.මිලියන) |
|---|---|---|
| ---------- | ------ | ------------- |
| RPI පෞද්ගලික සමාගම (මාලදිවයින් සමාගම) | 2018 | 1.806 (ඒ.ජ.ඩො මිලියන 9 ක්) |
| දේපළ ණය (603086277552) | 2020 | 164.73 |
| ටෙක්නො පාර්ක් ඩිවේලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් | 2021 | 750 |

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරිත්වය සෑම විටම අවදානම් අංශය විසින් ඉදිරිපත් කරන ලද අවදානම් වාර්තා සලකා බලනු ලබන අතර එය ඇගයීමට ලක් කර හොඳ ණය තීරණයක් ගැනීම ඉතා වැදගත් වේ. අවදානම් කළමනාකරණ අංශයේ මතය ණය කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා විශේෂයෙන් විශාල වටිනාකම් සහ සියලුම ආයතනික පහසුකම් පිළිබිඹු කරන සියලුම ණය පත්‍රිකා අවදානම් කළමනාකරණ අංශය වෙත ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සමඟ ණය කමිටු නිර්දේශය සහ අවදානම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් බැංකුවට ණය ලබා දීමටඇති අවස්ථාව, බැංකුවේ ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම, ඉහළ ප්‍රතිලාභ අනුපාතිකයක් උපයා ගැනීමේ අවස්ථාව, රටේ ආර්ථික සංවර්ධනය සඳහා වන ව්‍යාපෘතියේ ස්වභාවය හා වැදගත්කම යනාදිය වැනි වෙනත් කරුණු සලකා බලා යම් යම් තීරණ ගෙන ඇත. එසේ වුවද, වාර්තාවෙන් හඳුනාගත් අඩුපාඩු ඉදිරියේදී නැවත සිදු නොකිරීමට කටයුතු කරනු ඇත.

අදහස් දැක්වූ ගනුදෙනුකරුවන්ට ණය අනුමත කිරීමට පෙර අවදානම් කළමනාකරණ අංශය විසින් ඉස්මතු කරන ලද අවදානම් සම්බන්ධ නිර්දේශ සහ අදහස් කෙරෙහි බැංකුව අවධානය යොමු කළ යුතුය.

| | | |
|---|---|---|
| 2023 මැයි 31 දිනට එම ණය තුනේ මුළු හිඟ ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 3.791 ක්, රු.මිලියන 164 ක් සහ රු.මිලියන 750 ක් විය. | | |
| (ii) බැංකුවේ අවදානම් කළමනාකරණ අංශය විසින් 2018 වර්ෂයේ සිට තෝරාගත් අලාභ සිදුවීම් සඳහා මූල හේතු විශ්ලේෂණය (Root Cause analysis) සිදු කර ඇති අතර නැවත සිදුවීම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පාර්ශ්වයන්ගේ අවධානයට යොමු කර ඇත. කෙසේ වෙතත්, බැංකුවේ කාර්ය මණ්ඩලයේ එවැනිම වංචනික ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය විය. එබැවින්, අවදානම් කළමනාකරණ අංශය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශ්වයන්ගේ අවධානය යොමු වී නොමැති බව අනාවරණය විය. | සාමාන්‍යාධිකාරීවරයාගේ චක්‍රලේඛ අංක 769/2010 සහ තවත් බොහෝ දේ ඇතුළුව අභ්‍යන්තර පාලනයන්ට අදාළ අත්‍යවශ්‍ය චක්‍රලේඛ සමඟ දැඩි ලෙස අනුකූල වීම ශාඛා කළමනාකරණ අංශය සහතික කරයි. මීට පෙර සිදු වූ වංචා සිද්ධීන්ට අදාළ මෙහෙයුම් මූල හේතු ආමන්ත්‍රණය කරමින් වෙනත් විවිධ චක්‍රලේඛ සහ උපදෙස් ලිපි ද ශාඛා කළමනාකරණ අංශය විසින් නිකුත් කර ඇත. විය හැකි අවදානම් සහ වංචාවලින් ආරක්ෂා වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පිළිවෙත් අනුගමනය කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් මෙම චක්‍රලේඛ අපගේ ශාඛා සඳහා පරිපූර්ණ මාර්ගෝපදේශ සපයයි. 2018 න් පසු හඳුනාගෙන ඇති වංචාවන් සඳහා මූලික හේතු ආමන්ත්‍රණය කිරීම සඳහා පහත උපදෙස් ලිපි නිකුත් කර ඇත. (2019.10.21 දිනැති අංක 569/2019,2018.10.18 දිනැති අංක 469/2018 සහ 2022.02.09 දිනැති අංක 649/2022 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ (මෙහෙයුම්) උපදෙස් ලිපි සහ 2019.03.05 දිනැති අංක 535/2019 සහ 2018.03.09 දිනැති අංක 483/2018 දරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ උපදෙස් ලිපි)<br><u>අඛණ්ඩ ශාඛා පරීක්ෂණ</u><br>අභ්‍යන්තර පාලනයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, අභ්‍යන්තර විගණන අංශය මගින් පවත්වනු ලබන සවිස්තරාත්මක විගණන සහ විස්මිත විගණනවලට (Surprised Audit) අමතරව ප්‍රාදේශීය කළමනාකරුවන් අඛණ්ඩ ශාඛා පරීක්ෂණ පවත්වයි. 2020 සහ 2021 වසරවල පැවති කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් භෞතික ශාඛා පරීක්ෂා කිරීම් සීමා වී තිබුණද, | අඛණ්ඩ වංචනික ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා, වාර්තා වූ සිද්ධීන් සම්බන්ධයෙන් බැංකුව දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

<table>
<tr>
<td></td>
<td></td>
<td>සුපරීක්ෂාකාරීව සහ අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටිවලට අනුකූලව කටයුතු කිරීම සඳහා මාර්ගගත ක්‍රම හරහා අඛණ්ඩ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම අප විසින් සහතික කර ඇත. අඛණ්ඩ ශාඛා පරීක්ෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීමේ ක්‍රියාවක් ලෙස ප්‍රාදේශීය කළමනාකරුවන් අමතමින් 2023.06.20 දිනැති උපදෙස් ලිපිය නිකුත් කර ඇත.<br>මෙහෙයුම් ගැටළු විසඳීම සඳහා ශාඛා කළමනාකරණ අංශය විසින් අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇති අතර, පද්ධති ගැටළු/සීමාවන් හේතුවෙන් සමහර වංචාවන් සොයා ගෙන ඇත. එබැවින්, පද්ධතිය තුළ යම් පාලනයක් හඳුන්වා දෙන ලෙස තොරතුරු තාක්ෂණ අංශයට දන්වා ඇත.</td>
<td></td>
</tr>
<tr>
<td>ඈ</td>
<td>1973 සිට 1996 දක්වා කාලය තුළ අනුරාධපුර, ඇල්පිටිය, ගල්නෑව, කතරගම, කිරිඳිවැල, මොණරාගල, රත්නපුර සහ කැකිරාව යන ප්‍රදේශවල පිහිටි ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා බැංකුව රු. මිලියන 83.6ක් වැය කර තිබුණද, 2022 වර්ෂය අවසන් වනවිටත් එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි.</td>
<td>අදාළ බලධාරීන් සහ ඉඩම් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර බදු ගිවිසුම් අත්සන් කිරීමට බැංකුව කටයුතු කරමින් සිටී.</td>
<td>සාධාරණ කාලයක් තුළ ඉහත ඉඩම් සඳහා බැංකුව විසින් බදු අයිතිය ලබා ගත යුතුය.</td>
</tr>
<tr>
<td>ඇ</td>
<td>ශාඛා කළමණාකරුවන්ගෙන් ලද තහවුරු කිරීම්වලට අනුව, 2023 අප්‍රේල් 30 වන දිනට රු.328,969,565 ක් වූ ප්‍රදානය කරන ලද ණය මුදල්වලට අදාළ ණය ලිපිගොනු 425 ක් අස්ථානගත වී තිබුණි. අස්ථානගත වූ ණය ලිපිගොනු අතර පුද්ගලික ණය ලිපිගොනු 134 ක්, නිවාස ණය ලිපිගොනු 272 ක්, නීති ලිපිගොනු 10 ක් සහ ස්ථාවර තැන්පතු මත ණය ලබා දී ඇති ණය ලිපිගොනු 9 ක් ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>(i) මෙම අස්ථානගත වූ ණය ලිපිගොනු 425 න් සියයට 30 ක් හෙවත් ණය ලිපිගොනු 126 ක් අක්‍රීය ණය ගණයට අයත් විය. ඒවා අතරින් ලිපිගොනු 30 ක් නිවාස ණයවලට, ලිපිගොනු 95 ක් පුද්ගලික ණයවලට සහ එක්</td>
<td>අතුරුදහන් වූ ණය ලිපිගොනු මාසිකව නිරීක්ෂණය කරන ලෙස සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්ට උපදෙස් දී ඇත.<br>ණය කම්ටුව කාර්තුමය පදනමින් යාවත්කාලීන කරනු ඇත.<br>අතුරුදහන් වූ ණය ලිපිගොනු පිළිබඳ නවතම තත්ත්වය පහත පරිදි වේ.<br>
<table>
<tr><th>පළාත අනුව අස්ථානගත වූ ණය ලිපිගොනු</th><th>එකතුව</th></tr>
<tr><td>මධ්‍යම</td><td>52</td></tr>
<tr><td>නැගෙනහිර</td><td>0</td></tr>
<tr><td>වයඹ</td><td>24</td></tr>
<tr><td>උතුර</td><td>3</td></tr>
<tr><td>සබරගමුව</td><td>10</td></tr>
<tr><td>බස්නාහිර 12</td><td>23</td></tr>
<tr><td>දකුණ</td><td>7</td></tr>
</table>
</td>
<td>සෑම ශාඛාවකම ලිපිගොනු කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.</td>
</tr>
</table>

ලිපිගොනුවක් තැන්පතුවලට එරෙහි ණයවලට අදාළ ඒවා වේ. 2023 අප්‍රේල් 30 දිනට එම අක්‍රීය ණයවල මුළු හිඟ මුදල රු. 50,325,463 ක් වූ අතර එය ලබා දී ඇති මුළු මුදලින් සියයට 66 ක් නියෝජනය කරයි.

(ii) අස්ථානගත වූ ණය ලිපිගොනු 425 න්, රු.2,766,086 ක මුළු හිඟ ශේෂයක් සහිත ණය ලිපිගොනු දහයක් නීතිමය කටයුතු යටතේ පවතී. මෙම ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන් බැංකුවට ණය ගැණුම්කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූ අතර ණය ආපසු අයකර ගැනීමෙන් පසු ගනුදෙනුකරුවන්ගේ ඔප්පුව මුදා හැරීමට නොහැකි වේ. මෙය දිගුකාලීනව බැංකුවේ යහපත් ප්‍රතිරූපයට බාධාවක් විය හැකිය.

(iii) අස්ථානගත වූ ණය ලිපිගොනු 425 න්, ගංවතුර තත්ත්වය හේතුවෙන් කඩුවෙල ශාඛාවේ ණය ලිපිගොනු 254 ක් හෙවත් සියයට 59 ක් අස්ථානගත වී ඇත. ඉන් ණය ලිපිගොනු 35 ක් අක්‍රීය ණය ගණයට අයත් විය. මෙම ණයවල මුළු හිඟ ශේෂය රු.16,266,596 ක් විය.

(iv) ප්‍රධාන කාර්යාල ශාඛාවේ අස්ථානගත වූ ණය ලිපිගොනු සංඛ්‍යාව 24 ක් වූ අතර ඉන් ණය ලිපිගොනු 20 ක් අක්‍රීය නිවාස ණය කාණ්ඩය යටතේ පවතී. ඉන් ලිපිගොනු 16 ක් එම ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයකු විසින් සිදු කරන ලද වංචාවකට අදාළ ඒවා විය. ණය ලිපිගොනු නොමැතිවීම හේතුවෙන් වංචා සිදු කළ කාර්ය මණ්ඩල සාමාජිකයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ගැටළු සහගත වේ.

| | | |
|---|---|---|
| බස්නාහිර 1 | 23 | 142 |
| **වංචනිකව ප්‍රදානය කළ ණය ලිපිගොනු** | | |
| බස්නාහිර 1 | 16 | 16 |
| **ගංවතුර හේතුවෙන් විනාශ වූ ණය ලිපිගොනු** | | |
| බස්නාහිර 1 | 254 | 254 |
| **මුළු එකතුව** | | **412** |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.3.1 ණය ලබාදීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | 2022 දෙසැම්බර් 31 දිනට ආයතනික ණයවල මුළු හිඟ ශේෂය රු. මිලියන 90,191.55 ක් වූ අතර ඉන් රු. මිලියන 5,908.13 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ පවතී. මෙම මුළු හිඟ ශේෂය 2023 මැයි මස අවසානයේදී රු. මිලියන 90,445 දක්වා වැඩි වී ඇති අතර ඉන් රු. මිලියන 5,730 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි. ඉහත අක්‍රීය ණය ශේෂයෙන් සියයට 66 ක් විදේශ ණය නියෝජනය කරන අතර සියයට 29 ක් භාණ්ඩාගාර ඇපකර මගින් සුරක්ෂිත කර ඇති රජයට සම්බන්ධ සමාගම් දෙකකට ලබා දුන් ණය නියෝජනය කරයි. | ණය ආපසු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් / එකඟතාව ලබා ගැනීම සඳහා ශිර්ෂගත විදේශ ණය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.<br>රාජ්‍ය ආයතන දෙකට සම්බන්ධ අක්‍රීය ණය, ජාතික ජල සම්පාදන භාජලාපවහන මණ්ඩලයට සහ ටෙක්නොපාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් වෙත අදාළ වේ.<br>ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ හිඟ මුදල් පසුව ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයවිසින් 2023.07.28 සහ 2023.08.28 යන දිනයන්හිදී පියවා ඇත.<br>ටෙක්නොපාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ්හි අක්‍රීය ණයතත්ත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට දිගින් දිගටම දැනුම් දුන් අතර, ගැටලුව විසඳීම සඳහා සහාය ඉල්ලා ඇත.<br>රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023.06.21 දිනැති ලිපිය මගින් මෙම කාරණය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව බැංකුවට දැනුම් දී ඇත.<br>බැංකුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අමතා අදාළ නිලධාරීන් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කිරීමට රැස්වීමක් ඉල්ලා ඇත. රැස්වීම් දිනයක් තවමත් ලබා දී නොමැත. | බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| ආ | 2023 මැයි 31 දිනට බැංකුව විසින් ලබා දී ඇති රු. මිලියන 5 කට වැඩි ණයවල හිඟ ශේෂය රු. මිලියන 23,338 ක් විය. මුළු හිඟ මුදලින් රු. මිලියන 22,151ක් හෙවත් සියයට 95ක් ශාඛා හරහා ප්‍රදානය කර තිබූ අතර ඉතිරි සියයට 5, | 2021/2022 වර්ෂවල රට තුළ පැවති අසාමාන්‍ය ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඉහළ උද්ධමනය පාලනය කිරීමේ පියවරක් ලෙස ඉහළ ප්‍රතිපත්ති පොලී අනුපාත පවත්වා ගැනීම ණය වාරික ඉහළ යාමට හේතු විය. ජීවන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගිය | බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගැයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සහ බැංකුවේ අක්‍රීය ණය ශේෂය අවම |

ණය අංශය හරහා ප්‍රදානය කර තිබුණි. 2023 මැයි 31 දිනට ශාඛා හරහා ලබා දී ඇතිරු. මිලියන 10,136 ක් හෙවත් සියයට 45.7 ක ණය සහ ණය අංශය හරහා ලබා දී ඇති රු. මිලියන 1,062 ක් හෙවත් සියයට 89.5 ක ණය අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි.

පසුබිමක මෙය සිදු විය. මෙම සාධක මගින් ණය අක්‍රීය ණය වීමට ඉඩ ඇති පරිසරයක් නිර්මාණය විය. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව නිතිපතා ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා විවිධ සීමා පැනවූ අතර, එය කොවිඩ්-19 වසංගත කාල පරිච්ඡේදයේ සිට 2022 අවසානය දක්වා පැවතුණි. කෙසේ වෙතත්, අක්‍රීය ණය සඳහා නිසි අධීක්ෂණ සහ පාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා බැංකුව පහත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.

- බැංකුවේ ඉහළම අක්‍රීය ණයගනුදෙනුකරුවන් 100 දෙනා අයකර ගැනීමේ අංශය විසින් අඛණ්ඩව අධීක්ෂණය කරන අතර අවශ්‍යයෙන්ම පසු විපරම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.
- දැනට පවතින ප්‍රධාන කාර්යාලයට වාර්තා කරන ප්‍රධාන කාර්යාලයේ අයකර ගැනීමේ අංශයට අමතරව 2023 මාර්තු 01 වන දින බෙලිඅත්ත ප්‍රදේශයේ විශේෂිත ණය අයකර ගැනීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරඇත.
- අක්‍රීය ණය පාලනය කිරීමේ මාධ්‍යයක් ලෙස ණය උපලේඛණගත කිරීමට සහ ප්‍රතිව්‍යුහගත කිරීමට පහසුකම් සැලසීම සඳහා "ණය ගැණුම්කරුවන්ට සහනදායි ක්‍රියාමාර්ග" යන මාතෘකාව යටතේ 2023 මාර්තු 13 දිනැති අංක 674/2023 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ උපදෙස් ලිපිය නිකුත් කර ඇත. මෙම මූල පිරීම 2023 මාර්තු 02 දිනැති මහ බැංකුවේ ලිපිය සමඟ සමපාත වේ.
- 2023 මැයි 23 දිනැති අංක 684/2023 දරන ලිපිය හරහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) විසින් අක්‍රීය ණය සම්පූර්ණයෙන් පියවීම සඳහා යොදා ගැනීමට සුදුසු පද්ධති පියවරයන් හඳුන්වා දී ඇත.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| | | මාර්ගෝපදේශ අනුව නීතිමය ක්‍රියාමාර්ග තාවකාලිකව අත්හිටුවන ලද ඒවා ඇතුළුව අක්‍රීය ණය සඳහා එන්තර වාසි නිකුත් කිරීම කඩිනම් කිරීමට උපදෙස් නිකුත් කර ඇත.<br>• ශාඛා මගින් ගනු ලැබූ අක්‍රීය ණය අයකර ගැනීමේ පියවරයන් පිළිබඳ මාසික ප්‍රගති වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදීමට පියවර ගෙන ඇත.<br>• 2023 අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි නව අක්‍රීය ණය පසු විපරම් කිරීම සඳහා ජංගම දුරකථන යෙදුමක් හඳුන්වා දී ඇති අතර, අක්‍රීය ණය අවම කිරීම සඳහා අලුතින් වර්ගීකරණය කරන ලද ණය ගිණුම් පසු විපරම් කිරීමට මෙම යෙදුම කාර්ය මණ්ඩලයට පහසුකම් සපයයි. | |
| ඇ | පුද්ගලයන් දෙදෙනෙකු සඳහා 2020 දෙසැම්බර් 23 දින බැංකුව විසින් රු.164,730,000 ක ඒකාබද්ධ දේපල ණයක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>(i) ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා ණය ගැණුම්කරුවන්ගේ ආදායම් මූලාශ්‍ර සත්‍යාපනය කිරීම සඳහා බැංකුව නිසි පාරිභෝගික ඇගයීමක් සිදු කර නොතිබුණි.<br>(ii) ආරම්භක අදියරේදී, ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සහ ණය ගැණුම්කරුවන්ගේ ව්‍යාපාරවල අවාසිදායක තත්ත්වය හේතුවෙන් ණය ලබා දීමට අධ්‍යක්ෂක මණ්ඩලය සහ ණය කමිටුව එකඟ වී නොතිබුණි. කෙසේ වෙතත්, ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් හිඟ මුදල් සහ ගණුදෙනුකරුවන්ගෙන් DTA රක්ෂණාවරණයක් නොගෙන, ආපසු ගෙවීමේ කාලය වසර 15 සිට අවුරුදු 20 දක්වා දීර්ඝ කරමින් සහ | එච්.එම්.ආර්.සී.එස්.රාජකරුණා සහ ජී.ඊ්.එන්.එම්. ඒකනායක - දේපළ වෙන්දේසිකර ණය අයකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව 2023.09.27 දින පුවත්පත් තුනක සහ රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත. තාවකාලික වෙන්දේසි දිනය 2023.11.14 ලෙස නියම කර ඇත. | බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගැයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සහ බැංකුවේ අක්‍රීය ණය ශේෂය අවම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |

සියයට 75 ක් වූ වටිනාකමට ණය අනුපාතය ඉක්මවමින් ඉහත ණය මුදල ලබා දීමට 2020 සැප්තැම්බර් 09 වන දින පැවති විශේෂ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

(iii) ඉහත සඳහන් කළ විශේෂ රැස්වීම සඳහා එකී ණය අනුමත කිරීමට විරුද්ධ වූ භාණ්ඩාගාර නියෝජිතයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් දෙදෙනකුට ආරාධනා කර නොතිබුණි. කෙසේ වෙතත්, එක් ණය ගැණුම්කරුවෙකුගේ සහභාගීත්වයෙන් ඉහත රැස්වීම පවත්වා තිබුණි. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල විනිවිදභාවය සැක සහිත වේ.

(iv) ණය ගැණුම්කරු වාරික දෙකක් පමණක් ගෙවා තිබුණු අතර රු. 39,363,397 ක් වූ වාරික 27 ක් ගෙවා නොතිබුණි. 2023 මැයි 31 දිනට මුළු හිඟ ණය ශේෂය රු. 164,008,906 ක් විය.

ඇ බැංකුව සහ මහජන බැංකුව විසින් 2018 ජුනි 14 දින RPI ප්‍රයිවට් ලිමිටඩ් නැමති මාලදිවයින් සමාගමකට එ.ජ.ඩොම්ලියන 10 ක සමෝදානික ණයක් (Syndicated Loan) ලබා දී තිබුණි. බැංකුව මුළු ණය මුදලින් සියයට 90 ක් වන එ.ජ.ඩොම්ලියන 9 ක දායකත්වයක් ලබා දී තිබුණි. ණය ගැණුම්කරු විසින් 2023 මැයි 31 වන දිනට කිසිදු ප්‍රාග්ධන ආපසු ගෙවීමක් හෝ එ.ජ.ඩො මිලියන 2.93 ක්වූ හිඟ පොලී ගෙවා නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i) ඉහත කී ණය මුදල සංචාරක කර්මාන්තය යටතේ ක්‍රියාත්මක වන විදේශීය සමාගමකට ඉදිකිරීම් කටයුත්තක් සඳහා ලබා දී තිබූ අතර මෙය ජාතික ඉතිරිකිරීමේ බැංකු

(i) ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 6 (ජී) වගන්තියට අනුව, අනෙකුත් බැංකු සහ මූල්‍ය ආයතන සමඟ සමෝදානික ණය (Syndicated

ජාතික ඉතිරිකිරීමේ බැංකුපනතේ දක්වා ඇති විෂය පථය තුළ සමෝදානික ණය

| | | |
|---|---|---|
| පනතේ දක්වා ඇති විෂය පථය යටතේ ආවරණය නොවේ. | Loan) සඳහා සහභාගී වීමට බැංකුවට බලය ඇත.<br>තවද, ණය ලබාදීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහ බැංකුවේ නීති අංශයෙන් අවශ්‍ය නීතිමය අවසරය ලබාගෙන ඇත. | (Syndicate loan) සඳහා බැංකුව සහභාගී විය යුතුය. |
| ii) ණය ලබාදීමට පෙර බැංකුව විස්තීරණ ණය ඇගයීමක් හෝ අවදානම් තක්සේරුවක් කර තිබේද යන්න සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නිරීක්ෂණය නොවිය. | (ii) සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ විස්තර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මාලදිවයිනේ ආර්ථිකය පිළිබඳ අදහසක් ලබා ගැනීම සඳහා බැංකුව මාලදිවයිනේ මුදල් අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාසික ආර්ථික සමාලෝචන පරීක්ෂා කර ඇත.<br>මාලදිවයිනේ මූල්‍ය අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාසික ආර්ථික සමාලෝචනවල ප්‍රකාශයට පත් කරන ලද දත්ත සමඟ මූල්‍ය පුරෝකථනයන්හිදී භාවිතා කරන ලදපදිංචි කාලය වැනි උපකල්පනවල සාධාරණත්වය පරීක්ෂා කර ඇත. තවද, ඇතැම් හෝටල් වෙබ් අඩවිවල ප්‍රකාශිත සහ ට්‍රිප් ඇඩ්වයිසර් වැනි මූලාශ්‍ර වලින් මාලදිවයිනේ මේ සමාන හෝටල්වල කාමර ගාස්තු සංසන්දනය කරමින් ඇගයීම සිදු කර ඇත. ස්වාධීන ඇගයීම සිදු කිරීමේදී බැංකුව විසින් මෙම කරුණු සලකා බලා ඇත. තවද, නීතිමය අවදානම ආවරණය කිරීම සඳහා බැංකුවේ නීති අංශයෙන් අවශ්‍ය නිෂ්කාශන ලබා ගෙන ඇත. | මෙම ආකාරයේ පහසුකමක් ලබාදීමට පෙර බැංකුව විසින් විස්තීරණ ණය ඇගයීමක් සිදු කළ යුතුය. |
| iii) පශ්චාත් ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ සාමාන්‍යාධිකාරීවරයාගේ අංක 1641/2015 චක්‍රලේඛයට අනුව, ණය අනුමත කර මාස 3 ක් ඇතුළත බැංකුව ණය පහසුකම් සමාලෝචනය කර නොමැත. කෙසේ වෙතත්, සහකාර සාමාන්‍යාධිකාරි (අවදානම්) මගින් | (iii)පශ්චාත් ණය සමාලෝචන යාන්ත්‍රණය පැවැත්වීම අවදානම් කළමනාකරණ අංශයේ විෂය පථයට අයත් වේ. ආයතනික මූල්‍ය අංශය විසින් අදාළ ණය ලිපිගොනු සහ ඊට අදාළ අනෙකුත් සුරැකුම් ලියකියවිලි අවදානම් කළමනාකරණ අංශය වෙත පහත දිනවලදී යොමු කර ඇත. 2018/08/27, 2018/11/19, 2019/02/07, 2019/04/09, | බැංකුවේ අවදානම් අංශය චක්‍රලේඛ උපදෙස් අනුව සාධාරණ කාල සීමාවක් තුළ ණය සමාලෝචනය කළ |

| | | |
|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ණය) වෙත යවන ලද 2019 ජනවාරි 22 දිනැති අභ්‍යන්තර ලිපියට අනුව, පශ්චාත් ණය සමාලෝචන යාන්ත්‍රණය සඳහා ණය අනුමත කර මාස 3ක් ඇතුළත එම ණය ලිපි ගොනුව අවදානම් කළමනාකරණ අංශය වෙත ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | 2019/07/10, 2019/10/18, 2019/10/23, 2019/11/13 | යුතුය. |
| iv) පළමු ණය ලබා ගත් 2018 ජූනි 21 දින සිට බැංකුව විසින් ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා වසරක මූලික සහන කාලයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, හේතු කිහිපයක් සඳහන් කරමින් ප්‍රාග්ධන සහ පොලී ආපසු ගෙවීම සඳහා මූලික සහන කාලය 2018 ජූනි සිට 2022 ජූනි දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. | (iv) සටහන් කර ගෙන ඇත. සියලුම දිර්ඝ කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සිදු කර ඇත. | සාධාරණ හේතු මත මූලික සහන කාලය දීර්ඝ කළ යුතුය. |
| v) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2020 අංක 5 දරන චක්‍රලේඛය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත ව්‍යාපෘතිය සඳහා ප්‍රමාද සහනයක් (Moratorium Facility) ලබා දී තිබුණද, ණය ගැණුම්කරු විදේශිකයෙකු බැවින් මෙම ණය ඉහත සඳහන් චක්‍රලේඛයේ විෂය පථයට අයත් නොවේ. | (v) බැංකුවසහ මහජන බැංකුව විසින් සාමූහික ව්‍යාපාරික තීරණයක් ලෙස ව්‍යාපෘතිය සඳහා ප්‍රමාද සහනයක් (Moratorium Facility) ලබා දී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පිළිතුරට අනුව, ගනුදෙනුකරුගේ ඉල්ලීම් මත මෙවැනි පහසුකමක් සඳහා කිසියම් සහනයක් ලබා දීම බැංකුව විසින් ගනු ලබන ව්‍යාපාරික තීරණයකි. | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අදාළ නියෝග සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීම අවශ්‍ය වේ. |
| vi) 2021 ජූලි මාසයෙන් පසු කාලය සඳහා රක්ෂණ ආවරණය බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | (vi) රක්ෂණ ඔප්පුව අලුත් කර ඉදිරිපත් කිරීමට සේවාලාභියාට සිහි කැඳවීම් යවා ඇත. ප්‍රතිචාර වශයෙන් සේවාදායකයා විසින් ඇඟවුම් මිල කැඳවුම් පත්‍රිකාවක් සපයා ඇත. අලුත් කළ රක්ෂණ ඔප්පුව තවම ලැබී නැත. කෙසේ වෙතත්, බැංකුව මේ සම්බන්ධයෙන් අඛණ්ඩ පසු විපරමක් සිදු කරයි. | ගනුදෙනුකරුවන් විසින් නියමිත වේලාවට රක්ෂණය අලුත් කිරීම පිළිබඳව බැංකුව විසින් අධීක්ෂණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| vii) ණය ගිවිසුමට අනුව, එ.ජ. ඩො 270,000 ක අවම වටිනාකමක් සහිතව බැංකුවක ණය සේවා සංචිත ගිණුමක් (Debit Service Reserve Account – DSRA) විවෘත කර පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, ණය සේවා සංචිත ගිණුමෙහි (DSRA) අවම ශේෂය ණය ගැණුම්කරු (RPI) විසින් නඩත්තු කර නොතිබූ අතර 2023 මැයි 31 දිනට එම ගිණුමේ ශේෂය එ.ජ.ඩො 27,082.23 ක් විය. | (vii) ණය සේවා සංචිත ගිණුමේ (DSRA) අවම ශේෂය දක්වා ප්‍රතිපූරණය කරන ලෙස RPI වෙතින් අවස්ථා කිහිපයකදී ඉල්ලා ඇත. ණය ප්‍රමාද වූ විට අයවිය යුතු මුදල් අයකර ගැනීමට මෙම ගිණුමේ ඇති ශේෂය යොදා ගෙන ඇත. | ණය ගිවිසුම් අවශ්‍යතාවයට අනුව ණය සේවා සංචිත ගිණුම (DSRA) ගොඩනැගීම පිළිබඳව බැංකුව විසින් අධීක්ෂණය කළ යුතුය. |
| viii) ණය ගිවිසුමට අනුව, ණය දෙන්නන් විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ස්වාධීන ව්‍යාපෘති නිලධාරියෙකු ලෙස හෝටල් ඉදිකිරීම් පිළිබඳ සුදුසුකම් ලත් විශේෂඥයෙකු පත් කළ යුතුය. කෙසේ වෙතත්, ණය දෙන්නන් එවැනි පුද්ගලයෙකු පත් කර නොතිබූ අතර ආර්පීඅයි පුද්ගලික සමාගම විසින් එනම් ණය ගැණුම්කරු විසින් පත් කර ඇති වරලත් ප්‍රමාණ මිනින්දෝරුවරයාගේ (Chatered quantity Serveyor) ප්‍රගති වාර්තාව මත විශ්වාසය තබා තිබුණි. | (viii) මෙවැනි ව්‍යාපෘතියක ප්‍රගති වාර්තාවක් සැපයීමට අවශ්‍ය සුදුසුකම් සහිත වෘත්තිකයකු වන මොහොමඩ් සෝලා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා සමඟ ඉදිරියට යාමට සමෝධානික (Syndicated) ණය දෙන්නන් දෙදෙනාම තීරණය කර ඇත. | බැංකුව විසින් ණය ගැණුම්කරු විසින් පත් කරන ලද මිනින්දෝරු මත යැපීමෙන් තොරව ණය ගැණුම්කරුගෙන් ස්වාධීන වන සුදුසුකම් ලත් විශේෂඥයෙකු පත් කර තිබිය යුතුය. |
| ix) පවතින තොරතුරුවලට අනුව, ස්වාධීන පාර්ශ්වයක් හෝ සිවිල් ඉංජිනේරුවන් වැනි අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ නිපුණතා ඇති නිලධාරීන් විසින් කිසිදු වැඩබිම් පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. මෙම ඉදිකිරීම පරීක්‍ෂා කිරීමට අවශ්‍ය නිපුණතා ඇති දක්ෂ නිලධාරීන් බැංකුවේ සිටියද, ඉදිකිරීම්වල ගුණාත්මකභාවය සහ නිමවීම පිළිබඳව තාක්ෂණික දැනුමක් නොමැති ණය අංශයේ නිලධාරීන් විසින් බැංකුව වෙනුවෙන් වැඩබිම් පරීක්ෂාවක් සිදු කර තිබුණි. | (ix) බැංකුවේ සහ මහජන බැංකුවේනිලධාරීන් විසින් මෙම පහසුකම ලබා දීමට පෙර වැඩබිම් පරීක්ෂා කිරීම් සිදු කර ඇත. | අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ නිපුණතා ඇති නිලධාරීන් විසින් වැඩබිම් පරීක්ෂා කිරීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| x) 2022 ජුලි 04 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක 207/2022 අනුව, ආර්පීඅයි ප්‍රයිවට් ලිමිටඩ් හි සියලුම හිඟ මුදල් ආපසු අයකර ගැනීම සඳහා වඩාත්ම විචක්ෂණශීලී පිරිවැය ඵලදායී සහ කඩිනම් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සඳහා නීති, ඉංජිනේරු, මූල්‍ය සහ නියාමන, ණය ආදී විවිධ දෘෂ්ටිකෝණවලින් RPI පහසුකම පිළිබඳ ඉහළ මට්ටමේ සමාලෝචනයක් සිදු කිරීම සඳහා ස්වාධීන උපදේශකයෙකු පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.<br>• අංක 288/2022දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව, රු.9,684,400 ක සැලකිය යුතු සේවයේ යෙදීමේ ගාස්තුවක් යටතේ එම පැවරුම ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ගෝලීය ගිණුම්කරණ සමාගමක් පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. එම සේවයේ යෙදීමේ ගාස්තුවෙන් සියයට 75ක් බැංකුව විසින් දැනටමත් ගෙවා තිබුණි.<br>• ඉහත ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සේවයේ යෙදීමේ දින සිට සති හයක් ඇතුළත ලබාදීමට එම ගිණුම්කරණ ආයතනය එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්ථාවේ දින වන විට ඉල්ලීම් කිහිපයක් කර තිබියදීත්, එම වාර්තාව විගණකගේ සමාලෝචනය සඳහා ලැබී නොතිබුණි. බැංකුව එම වාර්තාව විගණනයට නිකුත් කිරීම සඳහා නීතිපතිවරයාගෙන් උපදෙස් සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් | හිඟ මුදල් අයකර ගැනීම සඳහා වඩාත් දූරදර්ශී පිරිවැය ඵලදායී සහ කඩිනම් ක්‍රියාමාර්ග නිර්ණය කිරීම සඳහා දැනුවත් සහ සලකා බැලූ තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකිවන පරිදි RPI වෙත ප්‍රදානය කරන ලද එ.ජ.ඩො මිලියන10 ක සමෝධානික ණය (Syndicated Loan) පිළිබඳ ඉහළ මට්ටමේ සමාලෝචනයක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි (PWC) සේවයලබා ගැනීමට 2022 සැප්තැම්බර් 15 වැනි දින පැවති බැංකුවේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය රැස්වීමේදී තීරණය කර ඇත. 2022 සැප්තැම්බර් 15 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය සිය රැස්වීමේදී ඉහත පැවරුම ඉටු කිරීම සඳහා හි සේවයලබා ගැනීමට, ගෙවීම් සන්ධිස්ථාන අනුව ගෙවීම් කිරීමට සහ සේවය යෙදීමේ ලිපියේ දක්වා ඇති දෛනිකවියදම් ගෙවීමට තීරණය කර ඇත.<br>2023 ජුනි 09 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී (ප්‍රතිසංවිධානය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය) එකී පැවරුම ඉදිරියට ගෙන නොයෑමට සහ මේ සම්බන්ධයෙන් ගරු. නීතිපතිගෙන් උපදෙස් ලබා ගැනීමට තීරණය කර ඇත. ඒ අනුව, 2023 ජුනි 19 වැනි දින නීතිපති වෙත එය යොමු කර ඇත.<br><br>PWC විසින් 2023 ජුනි 7 වන දින බැංකුව වෙත සිය මූල්‍ය හා බදු සමාලෝචන අතුරු වාර්තාව නිකුත් කරන ලද අතර 2023 අගෝස්තු 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී තක්සේරුව පිළිබඳ වාර්තාවසහ නීතිමය හා නියාමන සමාලෝචන වාර්තාව පිළිබඳ අතුරු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.<br><br>**PWC අවසන් වාර්තා**<br>PWC විසින් 2023.09.12 දිනැති ලිපිය මගින් පහත සඳහන් අවසන් වාර්තා | බැංකුව ණය ලබා දීමට පෙර ණය ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කළ යුතුය. අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා පිරිවැය ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.<br><br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (5) වගන්තියට අනුව, විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලත් කවර හෝ තැනැත්තකුට තම කාර්ය සහ කාර්තව්‍ය ඉටු කිරීමේදී සියලුම පොත්පත්, වාර්තා, වාර වාර්තා සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමට හිමිකම ඇති නිසා තොරතුරු නිකුත් කිරීමට නිර්දේශ කෙරේ. |

උපදෙස් පතන බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) විසින් 2023 අගෝස්තු 31 දින දන්වා තිබුණි.

- ආර්පීඅයි ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය, නෛතික සහ නියාමන රාමුව සහ මෙම ණයහි හිඟ මුදල අයකර ගැනීමේ වඩාත් විචක්ෂණ ක්‍රම හඳුනා ගැනීමට එම වාර්තාවෙන් බැංකුවට කිසියම් සහයක් ලැබී තිබේද යන්න තහවුරු කිරීමට විගණනයට සාක්ෂි නොවීය.

ඉදිරිපත් කර ඇති අතර එය මීළඟ රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.

i. මූල්‍ය හා බදු සමාලෝචනය පිළිබඳ අවසන් වාර්තාව
ii. තක්සේරුව පිළිබඳ අවසන් වාර්තාව
iii. නීතිමය සහ නියාමන සමාලෝචනය පිළිබඳ අවසන් වාර්තාව

**PWC බලය පැවරීමේ ලිපි**

PWC හි වාර්තාව ගරු. නීතිපතිවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැඩි රහස්‍ය පදනමක් මත ලබා දීමට PWC හි කැමැත්ත ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 ජූනි 9 වැනි දින පැවති සිය රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

මෙම වාර්තාව ආමන්ත්‍රණය කර නොමැති පාර්ශ්වයෙන් හානිකර නොවන ලිපියක් (Hold Harmless Letter) අත්සන් කිරීමේ කොන්දේසියට යටත්ව අතුරු වාර්තාව නිකුත් කිරීමට 2023.06.27 දිනැති ලිපියක් මගින් PWC විසින් එකඟ විය. බැංකුව මෙම වාර්තාව ලබාදීමට කැමති තුන්වන පාර්ශ්වයන්ගෙන් අවශ්‍ය හානිකර නොවන ලිපි ලබා ගන්නා ලෙස සහ වාර්තාවල අන්තර්ගතය දැඩි ලෙස රහසිගතව තබා ගන්නා බවටද සහතික වන ලෙස PWC විසින් බැංකුව වෙතින් ඉල්ලා ඇත. මීට අමතරව, මෙම වාර්තාව නිකුත් කිරීමට පෙර බලය පැවරීමේ ලිපියක් අත්සන් කරන ලෙසද බැංකුව වෙතින් PWC ඉල්ලා ඇත. 2023 ජූලි 12 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම කාරණය අධ්‍යක්ෂ මණ්ඩලවෙත ඉදිරිපත් කර ඇත.

බැංකුවවිසින් දේපල තක්සේරු වාර්තාව සහ නීතිමය හා නියාමන සමාලෝචන වාර්තාව ගරු. නීතිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා PWC හි කැමැත්ත ඉල්ලා ඇත. ඒ සඳහා ප්‍රතිචාර වශයෙන්, PWC විසින් 2023 අගෝස්තු 18 දිනැති ලිපියක් මගින් එහි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ජූලියස් නීති ආයතනය එල්එල්පී

(LLP) සහ සුනිල් ප්‍රනාන්දු ඇසෝසියේට්ස් හි කැමැත්ත ඇතිව එම වාර්තා නිකුත් කිරීමට බැංකුවට අවසර දී ඇත.
ලබන්නා කෙරෙහි යම් සැලකිල්ලක් දැක්වීමේ වගකීමකින් සහ එයින් පැන නගින ඕනෑම වගකීමකින් PWC ප්‍රැක්සිස් නීති ආයතනය එල්එල්පීසහ සුනිල් ප්‍රනාන්දු ඇසෝසියේට්ස් යන ආයතන නිදහස් කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන ලිපියට අත්සන් කරන ලෙස මෙම ලිපිය මගින් විශේෂයෙන් බැංකුව වෙතින් ඉල්ලා සිටී. ශ්‍රී ලංකාවේ ගරු. නීතිපති, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ මුදල් අමාත්‍යාංශය ඇතුලත් ඕනෑම බාහිර අධීක්ෂණ ආයතනයකට ගිවිසුම්ගත හෝ වෙනත් වගකීමක් PWC විසින් ප්‍රතික්ෂේප කරයි. 2023.08.23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම කාරණය අධ්‍යක්ෂ මණ්ඩලවෙත ඉදිරිපත් කර ඇත.

**ගරු. නීතිපතිගේ උපදෙස්**

RPI කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා උපදේශනයක් අතිරේක සොලිසිටර් ජනරාල් සුසන්ත බාලපටබැඳි මහතා සමඟ 2023 ජූලි 13 වැනි දින පැවැත්විණි. 2023 ජූලි 17 වැනි දිනැති ලිපිය මගින් එම ලිපියේ විස්තර කර ඇති තොරතුරු හැකි ඉක්මනින් ලබා දෙන ලෙස නීතිපති විසින් බැංකුන් ඉල්ලා ඇත.
ආර්පීඅයි පහසුකම සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් ගරු.නීතිපතිගේ උපදෙස් ලබා ගන්නා ලෙස කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි, දැඩි රහස්‍ය පදනමක් මත ගරු.නීතිපති, රජයේ විගණනය, මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය වෙත අතුරු වාර්තා නිකුත් කිරීමේ අරමුණින් එකඟතා ලිපිය/බලය පැවරීමේ ලිපි අත්සන් කිරීම සඳහා බැංකුවවෙත, ගරු.නීතිපතිගෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) විසින් නීතිපති උපදෙස් ඉල්ලා ඇත. මේ

| | | |
|---|---|---|
| | සම්බන්ධයෙන් ගරු. නීතිපතිගේ උපදෙස් ලැබීමට නියමිතය. 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපිවල පිටපත් අමුණා ඇත. | |
| ඉ 2019 සැප්තැම්බර් 23 වැනි දින ණය අංක 603086247060 යටතේ සහරාන් එන්ටර්ප්‍රයිසස් වෙත බැංකුව විසින් රු. 12,600,000 ක ණයක් ලබා දී තිබුණි. 2023 මැයි 31 දිනට හිඟ ශේෂය සහ මුළු හිඟ වාරික වල එකතුව පිළිවෙලින් රු. 12,929,827 ක් සහ රු.6,155,562 ක් විය. නිවසක් සහ දේපලක් මිලදී ගැනීමට මෙම ණය මුදල ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) මෙම ණය ගැණුම්කරුගේ ණය තොරතුරු කාර්යාංශතත්ත්ව වාර්තාවේ (CRIB Report) දක්වා ඇති ණය පහසුකම් 10ක අක්‍රමවත් ආපසු ගෙවීම් සැලකිල්ලට නොගෙන සහකාර සාමාන්‍යාධිකාරි (ණය) විසින් මෙම ණය අනුමත කර තිබුණි. | i) සටහන් කර ගෙන ඇත. ණය සඳහා ඉදිරිපත් කළ අනුමත පත්‍රිකාවේ ඒ කාරණය පැහැදිලිව සඳහන් කර ඇත. | බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| (ii) සහරාන් එන්ටර්ප්‍රයිසස් විසින් ණය ලබා ගැනීමේදී 2017 අගෝස්තු 10 දිනැති ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංක WA/11923 ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ සහ විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් සැපයීම සහ භාෂා ගනුදෙනු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය යටතේ මෙම ව්‍යාපාරයට අදාළ කිසිදු ව්‍යාපාර ලියාපදිංචියක් විගණනයට සොයා ගැනීමට නොහැකි විය. | (ii) ණය පහසුකම ලබා දීමේදී ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත සලකා බලා ඇත. | |
| (iii) මෙම ණය ගැණුම්කරු 2023 මැයි 31 වන විට එක් වාරිකයක් (01) පමණක් ගෙවා තිබූ අතර 2022 ජූලි | (iii) ණය ආපසු අයකර ගැනීම සඳහා පරාටේ (Parate) ක්‍රියාමාර්ගය | |

19 වන දින සහකාර සාමාන්‍යාධිකාරි (අය කිරීම්) මගින් දේපල වෙන්දේසි කිරීම පිළිබඳ අවසන් දැන්වීම ණය ගැණුම්කරු වෙත යවා තිබුණි. බැංකුව පරාටේ (Parate) ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කළ විට, වෙන්දේසිය වැළැක්වීම සඳහා 2023 ජනවාරි 18 දින ගනුදෙනුකරු විසින් වාරණ නියෝගයක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් නීති අංශය විසින් සිය ප්‍රොක්සි ගොනු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් අධිකරණය හමුවේ විරෝධතා ගොනු කිරීම 2023 ජූලි 21 දක්වා ප්‍රමාද විය.

දැනටමත් ආරම්භ කර ඇත. දේපල වෙන්දේසි කිරීම 2023.01.19 දින පැවැත්වීමට නියමිතව තිබුණි. ගනුදෙනුකරු වෙන්දේසිය වැළැක්වීම සඳහා වාරණ නියෝගයක් ලබා ගෙන ඇත. 2023.06.21 දින බැංකුව වාරණ නියෝගයට විරෝධතා ගොනු කර ඇත.

### 3.3.2 කාඩ්පත් මධ්‍යස්ථානයේ මෙහෙයුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විච්යේ (Common ATM Switch -CAS) මෙහෙයුම් සම්බන්ධයෙන් 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත (Payment and settlement System Act.) යටතේ 2022 පෙබරවාරි 28 දිනැති 2022 අංක 02 දරන පොදු නියෝගයේ 5.6 වගන්තියට අනුව, සෑම CAS සාමාජිකයෙකුම දත්ත සමුදායන් සහ CAS හි ක්‍රියාකාරිත්වයට අදාළ වන එහි සියලුම තොරතුරු සහ දත්ත නිතිපතා උපස්ථ (backup) කිරීම සහ පද්ධතියේ අසාර්ථකත්වයකදී හෝ දත්ත දූෂණය වීමකදී හෝ නැතිවීමකදී නැවත යථාවත් කිරිමේ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වගකිව යුතුය. කෙසේ වෙතත්, පාරිභෝගික මුදල් ආපසු ගෙවීම, ආරවුල් හැසිරවීම, අයකිරීම් සහ සැසඳීම් වැනි සමහර ප්‍රධාන කාර්යයන් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටිය පවත්වා ගැනීමට කාඩ්පත් මධ්‍යස්ථානය අසමත් වී තිබුණි. | කාඩ්පත් මධ්‍යස්ථානය විසින් සැසඳීම සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතිය වැනි ක්ෂේත්‍ර ආවරණය කරමින් එහි සියලුම ස්වයංක්‍රීය ක්‍රියාකාරකම් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියාත්මක කර ඇත. සේවාදායකය (Server) සහ දත්ත සමුදාය (Database) යන මට්ටම් දෙකෙහිම තොරතුරු තාක්ෂණ අංශය විසින් මෙම උපස්ථ (backup) උද්යෝගීව හසුරුවයි. කෙසේ වෙතත්, අයකිරීම් සැකසීම, ආරවුල් හැසිරවීම, මුදල් ආපසු ලබා දීම සහ අතිරේක සැසඳීම් වාර්තා ඇතුළු දෛනිකව අතින් සිදු කරනු ලබන කාර්යයන් පරිශීලක පරිගණකවල ගබඩා කර ඇත. වර්තමානයේ, මෙම කාර්යයන් සඳහා උපස්ථ (backup) කිරීම අතින් සිදු කරනු ලබන අතර බාහිර දෘඪ තැටි (External hard drives) මත පමණක් ගබඩා කරයි. කාඩ්පත් මධ්‍යස්ථානයේ පරිගණක සඳහා විශේෂයෙන් සකස් කරන ලද වඩාත් විධිමත් සහ ආරක්ෂිත | සුමට ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රධාන කාර්යයන් වෙනුවෙන් ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටියක් (Automated backup procedure) කාඩ්පත් මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යා යුතුය. |

උපස්ථ (backup) පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය සමඟ දැනට සාකච්ඡා කෙරෙමින් පවතී.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**විගණන නිරීක්ෂණය**

භාණ්ඩාගාර නියෝජිතයාගේ විරෝධය සැලකිල්ලට නොගෙන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ ඊට ඉහළ ශ්‍රේණි සඳහා කළමනාකරණ කමිටුව විසින් යෝජනා කරන ලද දීමනාවලට වඩා ඉහළ හානිපූරක සහ ඉන්ධන දීමනා අනුමත කර තිබුණි. එබැවින්, බැංකුවේ ලාභදායිතාවය ඉහළ නැංවීම සඳහා බැංකුවේ සේවක පිරිවැය අඩු මට්ටමක පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

| ශ්‍රේණිය | පැවති දිමනාව (රු.) | අනුමත දිමනාව (රු.) |
|---|---|---|
| සාමාන්‍යාධිකාරී | රු.175,000+ ඉන්ධන ලීටර 275 | රු.200,000+ ඉන්ධන ලීටර 275 |
| ජ්‍යෙෂ්ඨනියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | රු.150,000+ ඉන්ධන ලීටර200 | රු.175,000+ ඉන්ධන ලීටර 225 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | රු.125,000+ ඉන්ධන ලීටර 225 | රු.150,000+ ඉන්ධන ලීටර 225 |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 26 (2) සහ (3) වගන්තිවලට සහ එහි සංශෝධනවලට අනුව, බැංකුවේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි සලකන පරිදි නිලධාරීන් සහ සේවකයන් පත් කිරීමට මණ්ඩලයට හැකිය. තවද, සාමාන්‍යාධිකාරීවරයාගේ, අනෙකුත් නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ වැටුප් සහ ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි බැංකුව විසින් තීරණය කරනු ලැබේ.
තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටුවේ (BHRRC) ප්‍රඥප්තියේ 2.1 ඒ වගන්තියට අනුව, සාමූහික ගිවිසුම (Collective agreement) මගින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික හැර කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කරයි.
ඒ අනුව, 1 ශ්‍රේණිය සහ ඊට ඉහළ කාර්ය මණ්ඩලය සඳහා හානිපූරක සහ ඉන්ධන දීමනා වැඩි කිරීම BHRRC විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ

**නිර්දේශය**

එහි සේවකයින්ට පුද්ගල ප්‍රතිලාභ ලබා දීමේදී බැංකුවේ ලාභදායිතාවය සහතික කිරීම අවශ්‍ය වේ.

මණ්ඩලය විසින් අනුමත කර ඇත.

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | බැංකුව 2008 වසරේදී පර්චස් 38.8 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 50 ක කාලයක් සඳහා ලබාගෙන ඇත. මෙම ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කළමනාකාරිත්වය තීරණය කර තිබුණද, මෙතෙක් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි. | 2008 වසරේදී මෙම ඉඩම වසර 50කට බද්දටගෙන ඇත. 2009 නොවැම්බර් මාසයේදී බැංකුව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට යාබදව පර්චස් 106.69 ක ඉඩමේ ආක්‍රමණිකයන්ව නැවත පදිංචි කිරීම සඳහා බද්දට ගත් ඉඩම ලබා දී ඇත. මේ හේතුව නිසා එදා සිට මේ දක්වා බද්දට ගත් ඉඩමේ බැංකුව කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක නිරත වී නැත.<br>කෙසේ වෙතත්, ඉහත කී ඉඩමේ ආක්‍රමණිකයන්ට 2020 දී වෙනත් ස්ථානයක නිවාස ලබා දී ඇත. ඉන්පසුව, කොවිඩ්-19 පැතිරීම සහ රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘතිය දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදු විය. | නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |
| ආ | 2019 ජූනි මාසයේ සිට පිටකොටුව ශාඛාවේ ප්‍රයෝජනය සඳහා මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් බැංකුව කුලියට ගෙන තිබුණද, එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 4,629 ක විශාලත්වයෙන් යුත් තට්ටු දෙකක් භාවිතයට නොගෙන අක්‍රීයව පවතී. 2023 මැයි දක්වා කුලී වියදම් ලෙස බැංකුව රු. මිලියන 75.6ක් ගෙවා තිබුණි. | පෙර ස්ථානයේ ගොඩනැගිලි හිමිකරු එම ගොඩනැගිල්ලෙන් ඉවත් වන ලෙස බල කර ඇති අතර බැංකුව වසර 1 කට ආසන්න කාලයක් තිස්සේ පිටකොටුව ප්‍රදේශයේ සුදුසු ස්ථානයක් සොයමින් සිටියේ ය.<br>පැරණි ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබූ අතර අපගේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය කිහිප වතාවක්ම කල් ගියේය.<br>අවසාන වශයෙන්, ගොඩනැගිල්ලෙන් ඉවත් වීම බැංකුව තවදුරටත් ප්‍රමාද කරන්නේ නම්, යම් ද්‍රවශීලතා අලාභයක් ගෙවන ලෙස ගොඩනැගිලි හිමිකරු දැනුම් දී තිබුණි.<br>ඒ අවස්ථාවේදී වත්මන් | නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගොඩනැගිල්ල යෝජනා වූ අතර පිටකොටුව ශාඛාවේ කටයුතු සඳහා එකම සුදුසු ස්ථානය එය විය. ගොඩනැගිල්ලේ ප්‍රමාණය අවශ්‍යතාවයට වඩා වැඩි වුවද, තත්ත්වය සලකා බලා යෝජිත ස්ථානයට අනුමැතිය ලබා දීමට කළමනාකාරීත්වයට සිදු විය. ගොඩනැගිල්ලේ විශාලත්වය හැරුණු විට, වාහන නැවැත්වීමේ පහසුකම්, අධික වාහන තදබදයක් ඇති ප්‍රදේශයේ පිහිටීම සමඟ ස්ථානය ඉතා හොඳින් දැකගත හැකිය. ගොඩනැගිල්ලට තනි පිවිසුමක් ඇති අතර, ගොඩනැගිල්ලේ ඇති තරප්පු පෙළ හරහා තට්ටු තුනටම ගමන් කල හැක.<br>කෙසේ වෙතත්, බැංකුව පුහුණු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා 3 වන සහ 4 වන මහල් භාවිතා කරන අතර එහි කොටසක් මේ වන විට අවට ශාඛා විසින් ගබඩා කිරීමේ අරමුණු සඳහා භාවිතා කරයි. සියලුම මහල් වසර 100 කට පෙර ලී ව්‍යුහයෙන් සාදා ඇති බැවින්, ඉහළ මහල් වල අධික බර පැටවීම සඳහා භාවිතා කිරීම අනතුරු දායක වේ. | |
| ඇ | කොට්ටාව ශාඛාව විසින් 2020 අගෝස්තු සිට 2025 අගෝස්තු දක්වා (අවුරුදු 5) කාලයක් සඳහා රු. 200,000 ක මාසික කුලියට දැනට පවතින ගොඩනැගිල්ලේ පළමු මහල ලබාගෙන තිබුණි. ආරම්භයේදී ශාඛාව කුලී අත්තිකාරමක් ලෙස රු.3,600,000ක් ගෙවා ඇතත් (මාස 18ක්), නවීකරණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් මේ දක්වා එම මහල භාවිත කර නොතිබුණි. | ශාඛා මෙහෙයුම් මගින් ලබා දුන් නිර්දේශය මත පවතින තදබදය හේතුවෙන් පවතින ශාඛාව පුළුල් කිරීමේ අදහසින් කොට්ටාව ශාඛාවේ ඉහළ මහල කුලියට ගෙන තිබුණි.<br>කොවිඩ් 19 ව්‍යාප්තිය අතරතුර දෙපාර්ශවය විසින් ගිවිසුම අත්සන් කර ඇති අතර රට තුළ පැවති අගුලු දැමීම (lockdown) සහ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ගොඩනැගිලි හිමිකරු ගොඩනැගිල්ල භාර දීම ප්‍රමාද විය. පසුව, පරිශ්‍ර අංශය විසින් ඇස්තමේන්තු කරන ලද ඉහළ මහල පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, ව්‍යාපෘතියේ පිරිවැය පෙර පැවති මිලට වඩා දෙගුණයක් වීම හේතුවෙන් කළමනාකාරිත්වය විසින් කිහිප | නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වතාවක් සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව, බැංකුව යහපත් මූල්‍ය ස්ථාවරත්වයකට පැමිණෙන තෙක් බැංකුව විසින් සියළුම සංවර්ධන ව්‍යාපෘති කල් දමා ඇත. එතෙක් කිසිදු සංවර්ධන කටයුත්තක් නොමැතිව එම ඉඩ ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිත කරන ලෙස කොටටාව ශාඛාවේ කළමනාකරුට උපදෙස් දී ඇත. | |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ 2022 දෙසැම්බර් මාසය අවසන් වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද බැංකුවේ සේවක සංඛ්‍යාව 5408 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 4489 ක් විය. 2023 මැයි මාසය අවසන් වන විට තත්‍ය සේවක සංඛ්‍යාව 4454 ක් දක්වා අඩු වී ඇත. ඒ අනුව, පුරප්පාඩු 974 ක් සහ අනුමත නොකළ අතිරික්ත සේවකයින් 20 ක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.<br>i) විධායක මාණ්ඩලික සේවක සංඛ්‍යාව වූ 883 න් 184 ක් හෙවත් සියයට 21 ක් පුරප්පාඩු වී ඇති අතර එයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 02 ක්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් 07 ක්, ප්‍රධාන කළමනාකරුවන් 04 ක්, ජ්‍යෝෂ්ඨ කළමනාකරුවන් 51 ක්, කළමනාකරුවන් 54 ක් සහ සහකාර කළමනාකරුවන් 62 ක් ඇතුළත් විය.<br>ii) අධීක්ෂණ ශ්‍රේණියේ (III-III සහ IV ශ්‍රේණි) අනුමත සේවක සංඛ්‍යාව වූ 1593 න් 2023 මැයි මස අවසන් වන විට පුරප්පාඩු 509 ක් පැවතුණි.<br>iii) සම්පූර්ණ අනුමත සේවක සංඛ්‍යාව වූ5,408න් සියයට 54 ක් විධායක | අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු බඳවා ගැනීම් සහ උසස්වීම් මගින් පුරවනු ලබයි. බඳවා ගැනීම් සහ උසස්වීම් පිළිබඳ වර්තමාන යාවත්කාලීන කිරීම් පහත දැක්වේ.<br>**<u>බඳවා ගැනීම් මගින් පුරප්පාඩු පිරවීම</u>**<br>බැංකුව ලාභ ලැබීමට පටන් ගන්නා තෙක් සහ ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාවය පිළිබඳ නියාමන අවශ්‍යතා සපුරාලන තෙක් 2023.05.23 දිනැති ලිපිය මගින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ලබා දුන් උපදෙස් අනුව බඳවා ගැනීම් අත්හිටුවා ඇත.<br>තවද, III-III ශ්‍රේණියේ අභ්‍යාසලාභී නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටුව (BHRRC) විසින් අවලංගු කර ඇත.<br><br>**<u>උසස්වීම් මගින් පුරප්පාඩු පිරවීම</u>**<br>I ශ්‍රේණියට උසස්වීම් ලබාදී ඇත. සහකාර සාමාන්‍යාධිකාරි (බැංකු නොවන ප්‍රවාහය) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.<br>IIසහ III-I ශ්‍රේණිවලට උසස්වීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.<br>IV ශ්‍රේණියට උසස් කිරීම සඳහා | බැංකු කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තනතුරුවල අවශ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව නතුකර ගැනීමට බැංකුව සහතික විය යුතුය. |

නොවන (V සහ VI ශ්‍රේණි) සහ සුළු සේවක (VII ශ්‍රේණිය) ශ්‍රේණිවලට අදාළ විය. ඉන් 281ක් සහ 38ක් පිළිවෙළින් පුරප්පාඩු වූ සේවකයින් සහ කොන්ත්‍රාත් පදනම යටතේ වූ සේවකයින් විය.

iv) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකළ අතිරික්ත තනතුරු 20ක් සඳහා බැංකුව විසින් සේවකයන් බඳවාගෙන ඇත.

ලිඛිත විභාගය සහ සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත. මානව සම්පත්අංශය විසින් අංශවල සහ ශාඛා අංශයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳ මිනිස් බල සැලැස්මක් සකස් කර BHRRC අනුමැතිය සඳහා යොමු කර ඇත. අතිරික්ත තනතුරු ඒ අනුව ගැලපීම් කරනු ඇත.

| **තනතුර** | **බඳවා ගැනීම් සංඛ්‍යාව** |
|---|---|
| සහකාර සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති සහ ඉංජිනේරු) | 01 |
| ප්‍රධාන කළමණාකරු (BMD) | 01 |
| ප්‍රධාන කළමනාකරු (ITE -ඊ-බැංකු ඒකකය) | 01 |
| ප්‍රධාන කළමනාකරු (පුහුණු) | 01 |
| ප්‍රධාන කළමනාකරු (ණය) | 01 |
| කාර්යාල කළමනාකරු (සභාපති අංශය) | 01 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සහකාර ලේකම් | 01 |
| සහකාර කළමනාකරු (අංශ) | 06 |
| සහකාර කළමනාකරු (පරිපාලන) | 01 |
| සහකාර කළමනාකරු (තොරතුරු තාක්ෂණය) | 01 |
| පිළිගැනීමේ නිලධාරීන් | 04 |
| මෝටර් කාර්මික | 01 |
| **එකතුව** | **20** |

ආ 2021 දෙසැම්බර් මාසයේදී, බැංකුවේ සාමාන්‍ය බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව, පරිවාස කාලය ඉවත් කිරීම, වැටුප් පරිමාණය මූලික පියවරට වඩා ප්‍රධාන නීති නිලධාරි තනතුර පිළිවෙළින් 2021.01.24 සහ 2021.01.25 යන දිනවල සන්ඩේ ඔබ්සවර් සහ ඩේලි නිව්ස් හි ප්‍රචාරය අදාළ තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ දක්වා ඇති කොන්දේසිවලට

| | | | |
|---|---|---|---|
| | ඉහළින් තැබීම, සහතිකවල මුල් පිටපත සත්‍යාපනය නොකිරීම සහ අයදුම්කරුගේ ඉල්ලීම මත රාජකාරි භාර ගැනීම සඳහා මාස හයක දිගුවක් ලබා දීම වැනි අසාධාරණ ප්‍රතිලාභ ලබා දෙමින් බැංකුව විසින් ප්‍රධාන නීති නිලධාරි (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ශ්‍රේණිය) බඳවා ගෙන තිබුණි. මේ නිසා, නීති ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සහ වයස් සීමාව සඳහා නියම කර ඇති සුදුසු නිර්ණායක හරහා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වීම සීමා වී ඇත. | කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන්, අයදුම්පත් 16ක් ලැබී ඇත. තවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) ගේ 2021.01.22 දිනැති අංක 05/2021 දරන උපදෙස් ලිපිය මගින් සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් අයදුම්පත් 03ක් ලැබී ඇත. කෙසේ වෙතත්, ඉහත කී අයදුම්කරුවන් 19 දෙනාගෙන් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව අයදුම්කරුවන් 01 කෙනෙකු පමණක් එනම් කේ.ඩී ජයතිලක මෙනවිය සුදුසුකම් ලබා තිබුණි. අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව පිළිගත් මූල්‍ය ආයතනයක නීති ප්‍රධානී/ සහකාර සමාන්‍යාධිකාරි(නීති), /ප්‍රධාන කළමනාකරු(නීති), වශයෙන් වසර 5ක ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව පළපුරුද්ද අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකුට නොතිබුණි.<br>ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.03.31 දින පැවති රැස්වීමේදී කේ ඩීජයතිලක මෙනවිය ප්‍රධාන නීති නිලධාරි (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.<br>තවද, බැංකුව විශේෂිත තනතුරු සඳහා පිටතින් බඳවා ගන්නා විට, අයදුම්කරුවන් සාමානයෙන් වරප්‍රසාද සඳහා කේවල් කරයි. එවැනි තත්වයක් තුළ, තරඟකාරී වීමට සහ නිවැරදි අපේක්ෂකයා බඳවා ගැනීමට හැකි වන පරිදි වැටුප් පියවර තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත. | අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| ඇ | 2015 දෙසැම්බර් 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 40/0658/2015 අනුව, බැංකුවේ නීති අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් ජ්‍යෙෂ්ඨ කළමනාකරු-නීති (කොන්ත්‍රාත් පදනම මත) බඳවාගෙන තිබුණි. කෙසේ | බැංකුවේ නීති අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් ජ්‍යෙෂ්ඨ කළමනාකරු- නීති (කොන්ත්‍රාත් පදනම මත) බඳවාගෙන තිබුණි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ | එවැනි තනතුරකින් අපේක්ෂා කරන අරමුණු ප්‍රශස්ත කිරීම සඳහා කාර්ය මණ්ඩලය වෙන් කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙතත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ 2016 ජුලි 11 දිනැති අංක 385/2016 දරන ලිපිය මගින්, නිවාස ණය ලබාදීමට අදාළ කටයුතු සිදු කිරීම සඳහා එම නිලධාරියා මහනුවර ශාඛාවට අනුයුක්ත කර තිබුණි. ඉහත නිලධාරියා නීති අංශය සඳහා බඳවාගෙන තිබුණද, සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) විසින් අවධාරනය කරන ලද වෘත්තීය පළපුරුද්ද නොමැතිකම හේතුවෙන් මෙම බඳවා ගැනීමේ අරමුණ ඉටු නොවීය. සියලුම අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගිවන්නන්ගේ පළපුරුද්ද සහ පැමිණීමේ ලේඛනය යනාදි බඳවා ගැනීමට අදාළ විස්තර බැංකුව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අනුමැතිය ඇතිව, එම තනතුර එල කර ඇත. එම තනතුර සඳහා අයදුම් කල අයදුම්කරුවන් 6 දෙනෙකුගෙන්, අයදුම්කරුවන් 4 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇත. සියලුම අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද, සම්මුඛ පරීක්ෂණයෙදී පෙන්වන කාර්ය සාධනය සඳහා ලබා දී ඇති ලකුණු, බඳවා ගන්නා අවස්ථාවේදී ඇමුණුමක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. කෙසේ වෙතත්, උසස්වීම් සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සඳහා පැමිණෙන අයදුම්කරුවන් සඳහා මානව සම්පත් සංවර්ධන අංශය විසින් පැමිණීමේ පත්‍රිකාවක් පවත්වාගෙන ගොස් නොමැති බැවින්, එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | |
| ඇ | 2021 ඔක්තෝබර් 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටුව (BHRRC)) රැස්වීම් වාර්තාව BHRRC පත්‍රිකා අංක BHRRC /2021/55) සහ 2021 දෙසැම්බර් 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අංක-419/2021), බාහිරින් ලබා ගත් (Outsourced) සේවකයින්ගෙන්, බැංකුව විසින් කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 24 දෙනෙකු සහ ස්ථිර පදනම යටතේ සේවකයින් 27 දෙනෙකු බැංකුවේ සේවක සංඛ්‍යාවට බඳවාගෙන තිබුණි. මෙම සියලුම තනතුරු සඳහා විවෘත පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා නොතිබුණි. | දිගුකාලීන දුක්ගැනවිල්ලකට විසඳුමක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.09.17 දින පැවති රැස්වීමේදී 2019 ට පෙර 2015.03.26 දිනට බාහිරින් ලබාගන්නා පදනම මත ලබා ගත් සියලුම සේවකයින්ගේ සේවය සලකා බලා කොන්ත්‍රාත් පදනම මත අන්තර්ග්‍රහණය කිරීමට අනුමැතිය ලබා දී ඇත.<br>ඉන් අනතුරුව, 2017.03.08 දිනැති සාමාන්‍යාධිකාරීවරයා ගේ චක්‍රලේඛ අංක 902/2017 අනුව, අවම වශයෙන් වසර දෙකක කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවය කළ සේවකයින් රැකියා පරීක්ෂණයකට සහ සම්මුඛ පරීක්ෂණයකට යටත්ව ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සලකා බලා ඇත.<br>ඒ අනුව, බැංකුව දැනටමත් කාර්යාල සහකාර, යතුරු ලියනය කරන්නන්, දුරකථන ක්‍රියාකරුවන්, ඇමතුම් | තරඟකාරී බඳවා ගැනීම් සඳහා විවෘත දැන්වීම් මගින් අදාළ තනතුරු සඳහා අයදුම්පත් කැඳවිය යුතුය. |

| | | |
|---|---|---|
| | මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිතයන්, ඒ/සී කාර්මික, විදුලි කාර්මික, මෝටර් කාර්මික, පිළිගැනීමේ නිලධාරි සහ රියැදුරන් යන කාණ්ඩ යටතේ බාහිරින් ලබාගත් සේවකයින් අන්තර්ග්‍රහණය කර ඇත.<br>ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට නියමිත ඉහත කාණ්ඩවල සේවකයන් සුළු ප්‍රමාණයක් ඉතිරිව සිටි බැවින්, බාහිරින් ලබා ගත්/කොන්ත්‍රාත්/අභ්‍යාසලාභී පදනම මත සිටින ඉතිරි සේවකයන් පිළිබඳව තීරණයක් ගැනීමට බැංකුවට සිදු වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එම සියලුම සේවකයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සලකා බලන ලෙස සඳහන් කරමින් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | |
| (i) 2020 ජූලි 09 දින අනුමත කරන ලද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව, කාර්යාල සහකාරවරුන් බඳවා ගැනීමේදී ලිඛිත විභාගය සහ සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට පටහැනිව, ලිඛිත විභාගයක් නොපවත්වා සේවකයින් 03 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | 2021.12.09 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවකයින් 09 දෙනාගෙන්, ඉහත "ඇ" හි පැහැදිලි කර ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශයට පෙර, 2018 සහ 2019 වසරවලදී බාහිරින් ලබාගන්නා පදනම මත ලබා ගත් සේවකයින් 06 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත අන්තර්ග්‍රහණය කර ඇත. වසර 02 ක කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔවුන් රැකියා පරීක්ෂණයට මුහුණ දී ඇති අතර එබැවින් මාස 06 ක පරිවාස කාලයකට යටත්ව ඔවුන් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.12.09 දින අනුමැතිය ලබා දී ඇත.<br>රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා සහ නැගෙනහිර කලාපයේ හදිසි කාර්ය මණ්ඩල අවශ්‍යතාවයක් | අදාළ තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විසඳීම සඳහාද සභාපති අංශයේ අවශ්‍යතාවයකට අනුව බාහිරින් ලබාගන්නා පදනම මත ඉතිරි සේවකයින් තිදෙනා බඳවා ගෙන ඇත. | |
| (ii) “අභ්‍යාසලාභී ඇමතුම් මධ්‍යස්ථාන ආශ්‍රිතයන්” ( Trainee call Centre Associates) ලෙස සේවකයන් 17 ක් බැංකුවට බඳවාගෙන තිබුණි. ඔවුන් අතරින් අවම අධ්‍යාපන සුදුසුකම් නොමැති සේවකයන් දෙදෙනකු, 2018 දී ඔවුන්ව බාහිරින් ලබා ගන්නා අවස්ථාවේදී බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් නොමැති බව සඳහන් කරමින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර තිබුණි. කෙසේ වෙතත්, ඔවුන් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට පෙර 2018 සැප්තැම්බර් 07 දින බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව නිරීක්ෂණය විය.<br>2020 වසර අවසානයේ එක් වූ තවත් සේවකයින් හය දෙනෙකුට (6) අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුව අවම සුදුසුකම් නොතිබූ අතර ඔවුන් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර නොතිබුණි. කෙසේ වෙතත්, වසර දෙකක් ඇතුළත අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර වසර 02 ක කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ආකර්ෂණය කර නොගෙන සුදුසුකම් නොමැති පුද්ගලයින්ට අවම සුදුසුකම් සම්පූර්ණ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර 02 ක කාලයක් ලබා දීම ප්‍රශ්න සහගත විය. | ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිතයන් 17ක් බාහිරින් ලබා ගැනීමේ පදනම මත යොදවා පසුව බැංකුවේ ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර ඇත. ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධතා ආශ්‍රිතයන් 17 දෙනා අතරින්, 02 ක් 2018 දී බාහිරින් ලබා ගන්නා පදනම මත ලබා ගෙන ඇති අතර,ඔවුන් වසර දෙකක කොන්ත්‍රාත්තු කාලය සම්පූර්ණ කිරීමෙන් පසු සහ ඉහත “ඇ”හි පැහැදිලි කර ඇති පරිදි අනෙකුත් බාහිරින් ලබා ගත් කාර්ය මණ්ඩලය සඳහා අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටියට අනුව රැකියා පරීක්ෂණයෙන් සමත් වූ පසු ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර ඇත.<br>බාහිරින් ලබා ගන්නා පුද්ගලයින් බැංකුවේ ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමේදී මෙම ක්‍රියා පටිපාටිය සාමාන්‍යයෙන් අනුගමනය කර ඇත. | අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා ඇති අවම සුදුසුකම් තුළ බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (iii) 2020 සහ 2021 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනම යටතේ පුද්ගලයින් හය (6) දෙනෙකු රියදුරන් ලෙස බඳවාගෙන | රියදුරු තනතුර සඳහා දැනට පවතින බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කර ඇති අතර | අදාළ තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ දක්වා |

| | | |
|---|---|---|
| තිබුණි. රියදුරන් දෙදෙනෙකුගේ ජීව දත්ත පත්‍රිකා නිසි ක්‍රමවේදයක් ඔස්සේ අයදුම්පත් කැඳවීමකින් තොරව සාමාන්‍යාධිකාරීවරයා හරහා සභාපතිවරයා වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය විය. | BHRRC / අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරනු ඇත. | ඇති කොන්දේසිවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (iv) යතුරු ලියන්නන්ගේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුව, අපේක්ෂකයින්ට මිනිත්තුවකට වචන 70 ක අත්අකුරු ලිවීමේ වේගයක් සහ මිනිත්තුවකට වචන 25 ක යතුරු ලියනය කිරීමේ වේගයක් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා විභාගය පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, මූලික රැකියා පරීක්ෂණ සමත් වූ සේවකයින් දොළොස් දෙනෙකු ඉහත පරීක්ෂණය පැවැත්වීමට පෙර ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර ඇත. මූලික රැකියා පරීක්‍ෂණවලින් අසමත් වූ එක් යතුරු ලියන්නෙකුට ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට සලකා බැලීම සඳහා විභාගයට පෙනී සිට සාමාර්ථයක් ලබා ගන්නා තෙක් කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කිරීමට අවසර දී ඇත. සේවකයෙකුට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අතුරු කාලසීමාවක් ලබා දීම ප්‍රශ්න සහගත වේ. | රැකියා පරීක්ෂණයෙන් සාර්ථක නොවූ ඉතිරි යතුරු ලියන්නාගේ සේවය වසර පහක කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් 2022.12.01 සිට බලපැවැත්වෙන පරිදි අවසන් කර ඇත. | අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා ඇති අවම සුදුසුකම් තුළ බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (v) තරඟකාරී අපේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වයස් සීමාවන්, නියමයන් සහ කොන්දේසි, තෝරා ගැනීමේ ක්‍රමය යනාදිය ඇතුළත් කරමින් සෑම තනතුරක් සඳහාම බැංකුව විසින්බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සකස් කළ යුතුය. කෙසේ වෙතත්, පිළිගැනීමේ නිලධාරින් දෙදෙනෙකු සහ අභ්‍යාසලාභී තොරතුරු තාක්ෂණ ශිල්පීයකුඑම තනතුරු සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් නොමැතිව බඳවා ගෙන තිබුණි. | යෝජනා ක්‍රමයක් නොමැති තනතුරු සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සකස් කර ඇති අතර පවතින යෝජනා ක්‍රමසමාලෝචනය කිරීම අවශ්‍ය වන අතර ඒවා BHRRC /අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරනු ඇත. | අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් සෑම අනුමත සේවක තනතුරක් සඳහාම තිබිය යුතුය. |

ඉ කිසිදු දුෂ්කරතාවයකින් තොරව බැංකු කටයුතු කරගෙන යාම සඳහා ශ්‍රම බලකායක් සිටිනවාද යන්න පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් තොරව 2021 වසරේ සිට කාර්ය මණ්ඩලයේ 92 කට විදේශ නිවාඩු ලබාදීමට බැංකුව තීරණය කර තිබුණි. විස්තර පහත දක්වා ඇත.

| **වර්ෂය** | **කාර්ය මණ්ඩල සංඛ්‍යාව** |
| --- | --- |
| ------ | --------- |
| 2021 | 04 |
| 2022 | 29 |
| 2023 - 2023/06/02 දින විදේශ නිවාඩු අත්හිටුවන තෙක් | 23 |
| 2023-විදේශ නිවාඩු අත්හිටුවීමෙන් පසු අනුමැතිය ලබා ගැනීමට නියමිත | 36 |
| | **92** |

අධ්‍යයන/රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු මත විදේශගත වීමට අවසර දෙමින් බැංකුවේ චක්‍රලේඛයක් ඇති බැවින්, රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් එමඅරමුණ සඳහා වැටුප් රහිත නිවාඩු සේවකයින් ඉල්ලා ඇත.

මෙය බැංකුවටසැලකිල්ලට ගත යුතු කරුණක් වුවද, අනෙකුත් රාජ්‍ය බැංකු දෙක ද එම පදනම මත අනුමැතිය ලබා දුන් බැවින් සේවකයින් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම බැංකුව විසින් වළක්වා නැත.

තවද, HRC හි නිර්දේශ, BHRRC හි හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සහ බැංකුව සමඟ බැඳුම්කරක්හා ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව මෙම සේවකයින්ට විදේශගත වීමට අනුමැතිය ලබා දී ඇත.

බැංකු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් ති නොවන පරිදි බැංකුව විදේශ නිවාඩු අනුමත කළ යුතුය.

ඊ (i) 2021 ට පෙර ලබා දුන් විදේශ නිවාඩු හඳුනා ගැනීමට බැංකුවේ දත්ත සමුදායක් නොතිබුණි.

i). 2015 සිට 2021 දක්වා කාලය තුළ අධ්‍යයන/රැකියා කටයුතු සඳහා වැටුප් රහිත නිවාඩු මත සේවකයින් කිහිප දෙනෙකු පමණක් විදේශගත වී තිබුණි. එබැවින්, වෙනම දත්ත සමුදායක් පවත්වා ගෙන ගොස් නොමැත. කෙසේ වෙතත්, ඔවුන්ගේ විදේශ ගමන්වලට අදාළ සියලුම ලියකියවිලි ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු තුළ ගොනු කර ඇත.

තවද, එම කාලය තුළ බැංකුවේ නිවාඩු කළමනාකරණය අතින් හසුරුවන ලද අතර එය පවතින මානව සම්පත් පද්ධතියට සහ වැටුප් පද්ධතිවලට සම්බන්ධ නොවීය. එබැවින්, පද්ධතියකින් ජනනය කරන ලද වාර්තා ලබා ගැනීමට නොහැකි විය.

රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් වැටුප් රහිත

සියලු තොරතුරු සමඟ යාවත්කාලීන කරන ලද සේවක දත්ත සමුදාය බැංකුවේ තිබිය යුතුය.

| | | |
|---|---|---|
| (ii) ඉහත සේවකයින් 92 අතරින් සියයට 55 ක් හෙවත් සහකාර සාමාන්‍යාධිකාරී වරයකු (ප්‍රධාන කළමනාකාරීත්වය) ඇතුළුව සේවකයින් 51 ක් විධායක මට්ටමේ කාණ්ඩයට යටතේ වේ. | නිවාඩු මත විදේශ ගමන් සඳහා වන ඉල්ලීම් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇත. මේ අනුව, 2021 වසරේ සිට ලේඛනයක් පවත්වාගෙන ගොස් ඇත.<br>ii). අධ්‍යයන/රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු මත විදේශගත වීමට අවසර දෙමින් බැංකුවේ චක්‍රලේඛයක් ඇති බැවින්, රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් එම අරමුණ සඳහා වැටුප් රහිත නිවාඩු සේවකයින් ඉල්ලා ඇත.<br>මෙය බැංකුවට සැලකිල්ලට ගත යුතු කරුණක් වුවද, අනෙකුත් රාජ්‍ය බැංකු දෙක ද එම පදනම මත අනුමැතිය ලබා දුන් බැවින් සේවකයින් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම බැංකුව විසින් වළක්වා නැත.<br>තවද, HRC හි නිර්දේශ, BHRRC හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සහ බැංකුව සමඟ බැඳුම්කරක් හා ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව මෙම සේවකයින්ට විදේශගත වීමට අනුමැතිය ලබා දී ඇත. | බැංකු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් ඇති නොවන පරිදි බැංකුව විදේශ නිවාඩු අනුමත කළ යුතුය. |
| (iii)2009 මාර්තු 24 දිනැති අංක 739/2009 දරන සාමාන්‍යාධිකාරීවරයාගේ චක්‍රලේඛයට අනුව, සේවකයෙකුට හිමිවන ‘වැටුප් රහිත නිවාඩු’ නමින් නිවාඩු කාණ්ඩයක් නොමැති බව සඳහන් විය. තවද, එහි සඳහන් වුනේ ඉතා සුවිශේෂී අවස්ථාවන්හිදී බැංකුවේ අවසරය ඇතිව වැටුප් රහිත නිවාඩු ලබා දෙන බවයි.<br><br>කෙසේ වෙතත්, පසුගිය වසර දෙකහමාරක කාලය තුළ, වැටුප් රහිත නිවාඩු සඳහා ඔවුන්ගේ හේතු කුමක් වුවත්, ඉහත සේවකයින් 92 දෙනාට අවසර ලබා දීමට බැංකුව තීරණය කර තිබුණි. ඉන් සේවකයින් 46 දෙනෙකු උසස් අධ්‍යාපනය සඳහා ද සේවකයින් 43 දෙනෙකු රැකියා සඳහා ද සෙසු | (iii). අංක 739/2009 දරන සාමාන්‍යාධිකාරීවරයාගේ චක්‍රලේඛයේ 17 වැනි වගන්තිය යටතේ, බැංකුවේ අවම වශයෙන් වසර 04 ක සේවා කාලයක් ඇති ස්ථිර සේවකයෙකුට බැංකුවේ ඔහුගේ/ඇයගේ වෘත්තීය ජීවිතය තුළ වසර 05 කට නොවැඩි මුළු කාලයක් සඳහා අධ්‍යයන/රැකියා කටයුතු සඳහා විදේශ ගත වීමට වැටුප් රහිත නිවාඩු ලබා දිය හැකිය. ඒ අනුව, විදේශ ගමන් සඳහා බැංකුව වැටුප් රහිත නිවාඩු ලබාදී තිබුණි. | බැංකු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් ඇති නොවන පරිදි බැංකුව විදේශ නිවාඩු අනුමත කළ යුතුය. |

| | | |
|---|---|---|
| සේවකයින් 3 දෙනෙකු වෙනත් හේතූන් මත ද නිවාඩු ලබා ගැනීමට තීරණය කර තිබුණි. | | |
| (iv)වැටුප් රහිත විදේශ නිවාඩු ලබා දීමේදී, පිටත්වූ දිනයේ සිට වැටුප් රහිත නිවාඩු ලබා දීම වෙනුවට පෙර වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ වරප්‍රසාද නිවාඩු සහ වර්තමාන වර්ෂයේ වරප්‍රසාද නිවාඩු අඩු කිරීමෙන් පසු කාලය වැටුප් රහිත කාල සීමාව වශයෙන් බැංකුව විසින් සලකා තිබුණි. වැටුප් රහිත නිවාඩුවලින් අඩු කරන ලද දින ගණන දින 02 සිට දින 92 දක්වා පරාසයක පවතී. තවද, එවැනි අඩු කිරීම් සම්බන්ධයෙන් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් විගණනයට නිරීක්ෂණය නොවීය. | (iv). දිගු කාලීන වැටුප් රහිත නිවාඩුවක් ඉල්ලා සිටින විට, විදේශ ගමන් කාලයෙන් කොටසක් ආවරණය කිරීම සඳහා සේවකයින්ගේ ලබා නොගත් නිවාඩු හිමිකම මුලින් ප්‍රයෝජනයට ගැනීමට සහ ඉතිරි විදේශ ගමන් කාලය සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දෙන ලෙස සේවකයින් සෑම විටම ඉල්ලා සිටී. එබැවින්, ඔවුන්ගේ විදේශ සංචාර කාලයෙන් කොටසක් ආවරණය කිරීම සඳහා වර්තමාන වර්ෂයේ සහ පෙර වර්ෂයේ ලබා නොගත් වරප්‍රසාද නිවාඩු භාවිතා කරයි.<br>කාර්ය මණ්ඩලය ඉල්ලා සිටි පරිදි වැටුප් රහිත නිවාඩු මත විදේශගත වීමට අනුමැතිය ලබා දී තිබුණද වීසා ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ඇතැම් සේවකයන් පසු දිනක විදේශ ගත වී ඇත. මේ අනුව, ඔවුන් පිටත් වූ දින සිට බලපැවැත්වෙන පරිදි ඔවුන්ගේ නිවාඩු කාල සීමාවේ කොටසක් ආවරණය කිරීම සඳහා ලබා නොගත් වරප්‍රසාද නිවාඩු භාවිතා කර ඇත. | පිටවූ දිනයේ සිට වැටුප් රහිත නිවාඩු අනුමත කර ලබා දිය යුතුය. |
| (v) සේවක අර්ථසාධක අරමුදලේ අංක 6450 සහ 7799 දරන නිලධාරීන් දෙදෙනෙකුගේ විදේශ නිවාඩු ලබා දුන් කාලය පිළිවෙළින් 2021 දෙසැම්බර් 20 සහ 2023 ජූලි 03 දිනෙන් අවසන් වුවද, විගණිත දිනය වූ 2023 ජූලි 15 වැනි දින දක්වා ඔවුන් රාජකාරි භාරගෙන නොතිබුණි. එමෙන්ම, පිළිවෙලින් රු. 2,650,000 ක සහ රු. 4,100,000 ක ණය මුදලක් ඔවුන්ට ලබා දී තිබූ අතර එය බැංකුවට ආපසු අයකර ගැනීමට නොහැකි විය. 2023 ජූලි 15 දිනට එම ණයවල හිඟ ශේෂය පිළිවෙලින් රු. 2,438,938 ක් | (v). **සේවක අර්ථසාධක අරමුදලේඅංකය: 6450**<br>2021.12.20 සිට 2023.06.19 දක්වා කාලය සඳහා ඇයට නිවාඩු ලබා දී ඇත.<br>ඉහත කී සේවිකාව 2023.06.20 දින සිට එනම් සේවයට වාර්තා කිරීමට නියමිත දින සිට ඉල්ලා අස්විය. වැටුප් රහිත නිවාඩු මත විදේශ ගමන් සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේ ඇය කාර්ය මණ්ඩල නිවාස ණය පමණක් ලබාගෙන ඇත. හිඟ ණය වාරික කපා හැරීමෙන් පසු ඇයගේ සේවය අවසන් කිරීම මත | අදාළ සේවකයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහ රු. 3,785,909 ක් විය. | ගෙවිය යුතු මුදල් නිදහස් කර ඇත. සේවය අවසන් කිරීම මත ගෙවිය යුතු මුදල්වලින්හිඟ මුදල් අයකරගත් පසු, එම ණයවල නියමයන් සහ කොන්දේසි අනුව ඉතිරි ණය මුදල් අයකර ගැනීමට අයකිරීමේ අංශය කටයුතු කරනු ඇත.<br>**<u>සේවක අර්ථසාධක අරමුදලේ අංකය: 7799</u>**<br>එම නිලධාරියාට 2022.01.03 සිට 2023.07.03 දක්වා කාලය සඳහා නිවාඩු ලබා දී ඇත.<br>ඔහු 2023.07.04 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුවේ සේවයෙන් ඉල්ලා අස්විය.<br>අප විසින් 2023.08.28 දින සහකාර සාමාන්‍යාධිකාරි (අයකරගැනීම්) වෙතින් විමසීම් කර ඇති අතර, එම සේවකයා අංක 603086319875 සහ අංක 603086300342 දරන ණය සඳහා අද දක්වා හිඟ මුදල් නොමැතිව ගෙවීම් කර ඇති බව අපට දන්වා ඇත.<br>ඔහුගේ සේවය අවසන් කිරීම මත ගෙවිය යුතු මුදල් තවමත් නිදහස් කර නැත. සේවකයා ඔහුගේ ණය පියවූ පසු ඉල්ලා අස්වීම පිළිගනු ඇත. | |
| උ | (i) | බැංකුවේ මානව සම්පත් අංශය විසින් බැංකුවේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද වංචා සම්බන්ධයෙන් විනය පරීක්ෂණ ක්‍රියාපටිපාටි පැවැත්වීම සහ විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගත කර තිබුණි. අභ්‍යන්තර විගණන අංශයෙන් නිලධාරීන් 15 දෙනෙකු සම්බන්ධයෙන් වූ මූලික විමර්ශන වාර්තා ලැබීමෙන් පසු චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට මානව සම්පත් අංශයට මාස 6 සිට 25 දක්වා කාලයක් ගත වී ඇති බව නිරීක්ෂණය විය. | බැංකුවේ විගණන අංශය මූලික පරීක්ෂණයක් පවත්වන අතර බැංකු සේවකයින් විසින් සිදු කරන ලද විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් විමර්ශන වාර්තාව මානව සම්පත් සංවර්ධන අංශය වෙත යොමු කරයි. සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී විසින් අදාළ නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දෙන අතර, කෙටුම්පත් චෝදනා පත්‍ර සකස් කරන ලෙස විගණන අංශයට දැනුම් දෙනු ලැබේ. එකී චෝදනා පත්‍රවල ඇති චෝදනා පරීක්ෂා කර තහවුරු කිරීම සඳහා කෙටුම්පත් චෝදනා පත්‍ර නීති අංශය වෙත ඉදිරිපත් කර ඉන් අනතුරුව මානව සම්පත් සංවර්ධන | කාර්ය මණ්ඩල සාමාජිකයින්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීමේ සහ විනය ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියා පටිපාටිය බැංකුවකඩිනම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අංශය වෙත ඉදිරිපත් කරයි. අදාළ චෝදනා පත්‍ර අදාළ චූදිත නිලධාරීන්ට නිකුත් කරයි.<br>ඉන් අනතුරුව, එම චෝදනා පත්‍ර චූදිත නිලධාරීන් වෙත ලබාදී ඔවුන්ට එරෙහිව විධිමත් විනය පරීක්ෂණ පවත්වනු ලබයි.<br>විධිමත් විනය පරීක්ෂණ අවසානයේ විමර්ශන නිලධාරියාගේ නිර්දේශය මත සහ විනය කමිටුවේ අනුමැතිය ඇතිව වගකිව යුතු චූදිත නිලධාරීන්ට දඬුවම් නියම කරයි. ඒ අනුව, මෙම සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ. | |
| (ii) බැංකුවේ විනය සංග්‍රහයේ "ඒ" උප වගන්තිය යටතේ මානව සම්පත් අංශය මගින් බරපතල ස්වභාවයේ වංචාවන් සඳහා ලිහිල් දඬුවම් ලබා දී ඇති බව නිරීක්ෂණය වූ අතර එමඟින් බැංකුවේ කාර්ය මණ්ඩලය දඬුවම්වලට ඇති බිය අඩුවීම නිසා සිදු කරන වංචාවන් වැඩි විය හැක. පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය. | | කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කරනු ලබන වංචාවන් අවම කිරීමට හැකි වන පරිදි විනය ක්‍රියාමාර්ග සෘජු විය යුතුය. |

| <u>තනතුර</u> | <u>සිදුවීම</u> | |
|---|---|---|
| බදුල්ල ශාඛාවේ නිලධාරී (iii-iii ශ්‍රේණිය) | බැංකුවේ විනය සංග්‍රහය යටතේ බරපතල ස්වභාවයේ වංචා 5ක් ඇතුළුව වංචා 9ක් හේතුවෙන් 2013 මාර්තු 21 දින සිට මෙම නිලධාරියා සේවයෙන් පහ කර තිබූ අතර තවත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව 2017 ඔක්තෝබර් 19 දින එම වංචා 9න්ම ඔහුව නිදහස් කර තිබුණි. ඔහු තවත් වංචාවකට සම්බන්ධ වී බැංකුවට රු.6,834,500 ක අලාභයක් සිදු කර තිබියදී 2020 ඔක්තෝබර් 08 වැනිදා සිටඔහු නැවත සේවයේ පිහිටුවා තිබුණි. | බැංකුවේ බදුල්ල ශාඛාවට අනුයුක්තව සිටි අදාළ නිලධාරියාගේ සේවය අත්හිටුවා තිබුණි. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමෙන් පසු ඔහුට එල්ල වී ඇති චෝදනාවලට වැරදිකරු බව ඔප්පු වීමත් සමඟ ඔහු බැංකු සේවයෙන් පහ කර ඇත.<br>ඉහත කී විනය නියෝගයට එරෙහිව අදාළ නිලධාරියා විසින් කරන ලද අභියාචනයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත නැවත පරීක්ෂණයක් පවත්වා තිබුණු අතර එම පරීක්ෂණයෙන් සියලු චෝදනාවලින් නිදහස් වීමනිසා ඔහු යළිත් බැංකු සේවයට ඇතුළත් කර ඇත.<br>කෙසේ වෙතත්, බදුල්ල ශාඛාවේ උකස් අත්තිකාරම්වලට අදාළ තවත් විෂමාචාරයක් සම්බන්ධයෙන් ඔහුට |

| | | |
|---|---|---|
| | | එරෙහිව තවත් චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණි. එම චෝදනා පත්‍රයේ ඇති චෝදනා 15 න් 13 කට ඔහු වරදකරු බව ඔප්පු වී ඇත.<br>එම නිලධාරියාට විශ්‍රාම යාමට අනුමැතිය ලැබී ඇත. කෙසේ වෙතත්, ඔහුගේ සේවය අවසන් කිරීම මත ගෙවිය යුතු මුදල් මෙතෙක් ඔහුට නිදහස් කර නොමැත. |
| තිස්සමහාරාම ශාඛාවේ මුදල් කවුන්ටරයේ සේවය කළමාණ්ඩලික සහකාර II | මෙම නිලධාරිනිය 2019 ජනවාරි 21 වන දින විනය සංග්‍රහය යටතේ බරපතල ස්වභාවයේ වංචා සිදු කර තිබුණු අතර මාණ්ඩලික සහකාර I ලෙස පහත හෙලා තිබුණි. කෙසේ වෙතත්, පසුව 2023 ජුනි 08 වන දින සිදු කරන ලද විමර්ශනයට අනුව ඇය හක්මන ශාඛාවේ සේවය කරමින් සිටියදී තවත් බරපතල ස්වභාවයේ වංචාවන් සිදු කරතිබුණි. | තිස්සමහාරාම ශාඛාවේ සේවය කරමින් සිටියදී වංචනික ලෙස මුදල් කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් ඇයට එරෙහිව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලට එම නිලධාරිනිය වැරදිකරු බව ඔප්පු වී ඇත.<br>එම නිලධාරිනිය යළි සේවයේ පිහිටුවා ඇත.<br>එම නිලධාරිනිය හක්මන ශාඛාවේ සේවය කරමින් සිටියදී තවත් විෂමාචාරයකට සම්බන්ධ වී ඇත. ඒ නිසා ඇයගේ වැඩ තහනම් කර චෝදනා පත්‍රයක් නිකුත් කිරීමෙන් අනතුරුව විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත. |
| කිලිනොච්චි ශාඛාවේ විධායක නිලධාරී (ශ්‍රේණිය iii –iii) | මෙම නිලධාරියා 2019 වර්ෂයේදී උකස් භාණ්ඩ සම්බන්ධයෙන් බරපතල ස්වභාවයේ වංචා 6ක් සිදු කර තිබූ අතර වසරක් සඳහා වැටුප් වර්ධක කල් දමමින් බැංකුව විසින් මෙම නිලධාරියා විධායක (iv ශ්‍රේණිය) දක්වා පහත දමා තිබුණි. අදාළ චෝදනාවල බරපතලකම සැලකිල්ලට ගෙන සේවයෙන් ඉවත් කිරීම සහතික වුවද ඇයගේ අතීත සේවා වාර්තා සලකා බලා වහාම ක්‍රියාත්මක වන පරිදි යළි සේවයේ පිහිටුවීමට පාලනාධිකාරිය තීරණය කර තිබුණි. | විධිමත් විනය පරීක්ෂණයේදී ඇයට එරෙහිව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සියලු චෝදනාවලට එම නිලධාරිනිය වැරදිකරු බව ඔප්පු වී තිබුණද, විමර්ශන නිලධාරියා ඔහුගේ වාර්තාව මගින් අදාළ නිලධාරිනිය විමර්ශන මණ්ඩලයට ඉදිරිපත් කළ කරුණු සලකා බලා සේවයෙන් පහ කිරීම වෙනුවට තනතුරෙන්/ ශ්‍රේණියෙන් පහත හෙළීම වැනි දැඩි දඬුවමක් නියම කිරීමට නිර්දේශ කර ඇත.<br>එම කරුණු ද සැලකිල්ලට ගෙන |

විනය කමිටුවේ අනුමැතිය ඇතිව පහත දඬුවම්වලට යටත්ව අදාළ නිලධාරිනිය යලි සේවයේ පිහිටුවන ලදී.
වැඩ තහනම් කළ කාල සීමාව සඳහා කිසිදු වැටුපක් හෝ දීමනාවක් සඳහා හිමිකමක් නොලැබීම.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සමහර ඉලක්ක කල් දමා හෝ සමහර ඉලක්ක මූලික බැංකුකරණ පද්ධතිය අවසන් වන තෙක් රඳවා තබා ගෙන තිබුණි. මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යය සඳහා දත්ත එකතු කිරීමේ ස්වයංක්‍රීයකරණය, පොදු ලෙජරයේ ස්වයංක්‍රීයකරණය, මූල්‍ය වාර්තාකරණය, අයවැය ක්‍රියාවලිය සහ ව්‍යාපාර බුද්ධි ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්, තැපැල් බැංකු පද්ධතිය මූලික බැංකුකරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම, උකස් පද්ධතිය ඔරකල් බවට සංක්‍රමනය කිරීම සහ මෘදුකාංග නැවත ලිවීම යනාදි සමහර වැදගත් ඉලක්ක මූලික බැංකුකරණ පද්ධතිය අවසන් වන තුරු යථාර්ථවාදී නොවීය. | මූලික බැංකුකරණ කාලරාමුවට අනුව, මෙම ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. කෙසේ වෙතත්,එය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම නිසා මෙම ක්‍රියාකාරකම් කල් දමා ඇත. | වර්ෂය තුළදී සාක්ෂාත් කර ගැනීමට හැකි ඉලක්කයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් විය යුතුය. |